# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

**නො. 9,909—1948ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දිනවූ සිකුරාදා.**

PART IV.—හතරවෙනි කාණ්ඩය.

---

**උපාධිශ නීති.**

L. D.—B. 97/46.

1945යේ අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනත.

අංක 9,773 හා 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරන විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනලද ප්‍රකාශයෙන් සංශොධනය කරනලද ප්‍රකාර 1945යේ අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනතේ 52 වැනි වගන්තියෙන් අධිකරන අමාත්‍යතුමාට පැවරී තිබෙන බලය ප්‍රකාර එතුමා විසින් පනවනලද නියෝග.

1948 සැප්තැම්බර් මස 28 වැනි දින
කොළඹදීය.

ව්. සිවසුප්‍රමානියම්,
අධිකරන අමාත්‍ය කාර්‍ය මණ්ඩලයේ
ස්ථිර ලේකම් වෙනුවට.

**ගම්බද උසාවිවල සිවිල් නඩු විධාන නියෝග.**

I.—නඩුවක් පැවරීම (දැමීම).

1. (1) උසාවියට පැමිණිල්ලක් ඉදිරිපත්කිරීමෙන් නඩුවක් පැවරිය හැකිසි. එසේ නැතහොත් පැමිණිලිකරු විසින් තම නඩුව සභාපතිතුමාට කටවචනයෙන් කියාසිටිය හැකිසි. එවිට සභාපතිතුමා විසින් ඒ කියාසිටින කරුණු ලියා සටහන්කර ගන්නවා ඇත. ඒ සටහන නඩුවේ පැමිණිල්ල වන්නේය.

(2) සෑම පැමිණිල්ලක්ම එය ලැබුණු අනුපිළිවෙලින් නොම්මර කළ යුතුසි. එවිට ඒ පැමිණිල්ල නඩුවේද නඩුව පිළිබඳ දිනපතා සටහනේද, ආරම්භය වන්නේය.

(3) සෑම පැමිණිල්ලේම පහත දැක්වෙන විස්තර ඇතුලත්විය යුතුසි:—

(*a*) උසාවියේ නම;

(*b*) නඩුව පැවරූ දිනය;

(*c*) පැමිණිලිකරුගේ හා විත්තිකරුගේ නම් හා පදිංචි ස්ථාන;

(*d*) කර සිටින ඉල්ලීම පිළිබඳ සංක්ෂිප්ත සටහනක් හා ඒ ඉල්ලීමට හේතු ඇතිවූණේ කවදාද යන බව; හා

(*e*) පැමිණිලිකරු විසින් ඒ ඉල්ලීමෙන් යම් කොටසක් සිලව්කර හෝ අත්හැර තිබේනම් ඒ සිලව්කළාවූ හෝ අත්හැර දැමූවාවූ ගණන.

(4) ආඥාපනතේ 43 වැනි වගන්තියෙන් නියමිත මුද්දරය පැමිණිලිකරු විසින් සභාපතිතුමාට සපයාදිය යුතුසි. ඒ මුද්දරය සභාපතිතුමා විසින් පැමිණිලි පත්‍රයේ අලවා විස්වූ පරිදි අවලංගු කළ යුතුසි.

2. යම් විශෙෂ ඉඩම් පංගුවක් සම්බන්ධයෙන් හෝ විශෙෂ ඉඩම් පංගුවක යම් කොටසක් හෝ අයිතිවාසිකමක් සම්බන්ධයෙන් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ නඩුවක් පවරා තිබෙන විට ඒ ඉඩම් පංගුව, නමින් පමණක් සඳහන්නොකර, එහි බිම් ප්‍රමාණය හා මායිම් පැමිණිල්ලෙහි දක්වමින් හැකිතරම් දුරට විස්තර කළ යුතුසි. එසේ නැතහොත් පැමිණිල්ලට ඇමිණිය යුතුවූ සැලසුම් අන්දමේ සටහනක් හෝ ප්ලෑනයක් ගැන සඳහන්කරමින් විස්තර කළ යුතුසි.

3. (1) ඉල්ලීම සම්බන්ධයෙන් පොදු අයිතිවාසිකමක් ඇත්තාවූ සියල්ලන්ම එකම නඩුවේ පැමිණිලිකාරයන් කළ හැකිවේ. එවිට පැමිණිල්ලේ කිසිම සංශොධනයක් නොකොට සහනයක් ලැබිය යුතුයයි පෙනියන ඒ පැමිණිලිකරුවන්ගෙන් එක්කෙනෙකුට හෝ වැඩිදෙනෙකුට සහනය ලැබෙන අන්දමින් තීන්දුව දියහැකිවේ.

(2) එකම ගනුදෙනුවකින් පැන නගින්නාවූ හෝ ඉල්ලීම හා සම්බන්ධවූ හෝ කාරණයට සම්බන්ධකම් ඇත්තාවූ කරුණු එක නඩුවේම ඇතුළත් කළ හැකිවේ. ඒ එසේ වුවත් සභාපතිතුමාට මැනවැයි කල්පනාවන හැටියකින් එකම නඩුවකින් කර සිටින ඉල්ලීම් ගණන සීමාකිරීමට බලය තිබේ.

(3) යම් සහනයක් අයකරගනු ලැබීමේ හිමිකමට යටත්ව සිටින්නවුන්යයි කියනලද සෑමදෙනාම එකට හෝ වෙන් වසයෙන් විත්තිකරුවන් මෙන් ඇතුළත් කළ හැකිසි. තවද, ඒ එක් එක් අයගේ වගකීම් ඇතැයි පෙනෙන හැටියට ඔවුන්ගෙන් එක් කෙනෙකුට හෝ වැඩි දෙනෙකුට විරුද්ධව තීන්දුව දිය හැකිවේ.

(4) එකම නඩුවක ඉල්ලීම් එකකට වැඩි ගණනක් ඇතුළත්ව තිබෙනවිට, ඒ නඩුව ඇසීමට උසාවියට බලය ඇති නැති වග විසඳගන්නේ නඩුව පැවරූ දිනදී කළ ඉල්ලීම්වල පැවති මුළු වටිනාකම පිටවේ.

(5) නඩුවක් කීමට හෝ ඊට වගඋත්තර කියාසිටීමට පොදු අයිතිවාසිකමක් ඇති පාර්ශවකාරයන් බොහෝ දෙනෙකුන් සිටිනවිට ඒ පාර්ශවකාරයන්ගෙන් එක්කෙනෙකු විසින් හෝ වැඩිදෙනෙකුන් විසින් සභාපතිතුමාගේ අවසරය ඇතුව ඒ අයිතිවාසිකම ඇති සියලුම පාර්ශවකාරයන් වෙනුවෙන් ඒ නඩුව කීමට හෝ ඊට වගඋත්තර කියාසිටීමට පුළුවන.

4. ඉහත සඳහන් පරිදි පැමිණිල්ල දැමූවිට, සභාපතිතුමා විසින් විත්තිකාරයාට පෙනීසිටීමට දිනක් නියමකොට ඒ බව පැමිණිලිකරුට දන්වා ඒ දිනය නඩු පොතේ සටහන්කොට, සභාපතිතුමා විසින් තමාම හෝ තමා විසින් බලය පවරනලද යම් ලිපිකරුවකු විසින් හෝ අත්සන්කරනලද සිතාසියක්, ඒ සිතාසියෙහි සඳහන්කරනු ලබන දිනයකදී උසාවියේ පෙනීසිට පැමිණිල්ලට වගඋත්තර කියන ලෙස නියමකොට නිකුත්කිරීමට අණකළ යුතුය. එබඳු සෑම සිතාසියක්ම මීට යාකොට තිබෙන උප ලේඛනයේ අංක 1 දරණ පෝර්මයේ ප්‍රකාර විය යුතුසි.

5. සභාපතිතැන විසින් පැමිණිලිකරුගේ හෝ විත්තිකරුගේ ඉල්ලීම පරිදි, මීට යාකොට තිබෙන උප ලේඛනයේ අංක 2 දරණ පෝර්මයේ පෙනෙන අන්ග සම්පූර්ණවූ සිතාසි, ඒ සිතාසිවල නියමකර තිබෙන දිනයෙහි සාක්ෂිදීමට හෝ ලියවිලි ඉදිරිපත් කිරීමට පැමිණිය යුතුවූ අයවලුන් වෙත නිකුත්කළ හැකිසි.

## II.—සිතාසි ආදිය.

6. සියලුම සිතාසි පිටපත් දෙකකින් යුක්තවිය යුතුයි. සාමාන්‍යයෙන් ඒවා ගම් මූලාදෑනිතැනට භාරදිය යුතුයි. එහෙත් සිතාසි භාරකිරීම වඩා පහසුවෙන් හා ඉක්මනින් පූර්ණ වෙතැයි සභාපතිතුමාට ඒත්තුගියානම් ඒවා පිස්කල්තුමාට හෝ ඒවායේ නම් සඳහන්කොට ඇති යම් අයකුට හෝ භාරදිය හැකිසි.

7. (1) සිතාසියක් භාරකළයුත්තේ එහි නම් සඳහන්වන අයට ඉන් පිටපතක් අතටම භාරදීමෙන් විය යුතුයි. එසේ භාරකළ බවට වාර්තාවක් සිතාසියේ සටහන් කළයුතුයි. නැතහොත් ඊට ඇමිණිය යුතුයි. එහෙත් පාර්ශ්වකාරයන් දෙදෙනාම නඩුව පැවරූ දින උසාවියට පැමිණ නඩුවට සූදානම්ව සිටියහොත් සභාපතිතුමා විසින් විත්තිකරුට නඩුවේ සාරාංශය කියා පහදාදුන්නොත් විත්තිකරුට සිතාසි භාරකිරීම අවශ්‍ය නොවේ. එසේවූ කල සභාපතිතුමාට ඒ විගසම නඩුව ඇසීමට පටන්ගත හැකිවේ.

(2) භාරකිරීම සඳහා සිතාසිය යවනලද ගම් මූලාදෑනිතැන විසින් හෝ පිස්කල්තුමා විසින් හෝ වෙනයම් අයකු විසින් හෝ සෑහෙන තරම් උත්සාහ දරුත් සිතාසිය ලැබිය යුත්තාට අතටම භාරදීමට නුපුළුවන්වූ විටක, ඔහු විසින් ඒ බව, ඒ සිතාසියට අමුණනලද ලියවිල්ලක සටහන්කොට සභාපතිතුමාට රිපෝර්තු කළ යුතුය. එවිට සභාපතිතුමා ඉදිරිපිට ඉදිරිපත්කරනලද සාක්ෂිවලින් ඒ සිතාසියේ හෝ එවැනි ලියවිල්ලක නම සඳහන්වූ අය ලඟකාලේ වෙසෙන බව තමාට ඒත්තුගියවිට එහි පිටපතක් ඒ අයගේ ගෙයි හෝ ඒ අය සිරිත් වශයෙන් හැසිරෙන වෙනයම් ස්ථානයක හෝ හොඳින් පෙනෙන තැනක ගසා තැබීමට නියමකිරීමට බලය ඇත්තේය.

(3) සභාපතිතුමා විසින් කරනලද අණපරිදි එසේ ප්‍රතිකම් වශයෙන් කරනු ලබන භාරදීම සිතාසියේ නම සඳහන්වූ අයට එය අතින් භාරදුන්නාක් මෙන් බල සහිත වියයුතුයි.

(4) සභාපතිතුමා විසින් ප්‍රතිකම් වශයෙන් භාරදීමකට අණකරනු ලැබූ කොයි විටෙක වුවත් සිතාසියේ නම සඳහන්වන අයට ඒ ඒ කාරණයේදී අවශ්‍යවන හැටියට උසාවියේ පෙනීසිටීමට එතුමා විසින් යම්කිසි දින වේලා නියමයක් කළ යුතුයි.

## III.—උසාවියේ පෙනීසිටියාට පසු ක්‍රියාකරන අන්දම.

8. සිතාසියේ සඳහන් දිනයේදී දෙපාර්ශ්වයම උසාවියේ පෙනීසිටියොත් සභාපතිතුමා විසින් ආඥාපනතේ 23 වැනි වගන්තියේ ප්‍රකාර ඔවුන් අතර බේරුමක් ඇතිකිරීමට උත්සාහ දැරිය යුතුයි.

9. (1) දිවුරුම් ආඥාපනතින් (14 පරිච්ඡේදයෙන්) විධානකර තිබෙන පරිදි දිවිරීමක් හෝ සහතික කිරීමක් පිට නඩුව තීන්දුකරනවාට පාර්ශ්වකාරයෝ කැමතිවෙත් නම්, සභාපතිතුමා විසින් ඒ ආඥාපනත යටතේ ක්‍රියා කළයුතුයි.

(2) තීරණාත්මක දිවිරීමක් පිට හෝ සහතිකකිරීමක් පිට තම නඩුව බේරුමක් කිරීම ගැන පාර්ශ්වකාරයින් කැමතිවූවිට ඒ බේරුමකළ අන්දම සභාපතිතුමා විසින් බේරුම්කිරීමේ කොන්දේසි සහිතව නඩු පොතේ සටහන්කළ යුතුයි. තවද ඒ සටහන පාර්ශ්වකාරයන්ට තේරුම්කර දියයුතුවා පමණක් නොව ඊට ඔවුන් විසින් අත්සන්ද කළ යුතුවේ.

10. පැමිණිලිකරුගේ ඉල්ලීම විත්තිකරු ඒත්තුගනිතොත් ඒ ඒත්තුගැනීම සභාපතිතුමා විසින් නඩු පොතේ සටහන්කොට ඒ සටහනට අත්සන් කරන ලෙස විත්තිකරුට නියමකළ යුතුයි. ඊට පසු ඒ ඒත්තුගැනීම අනුව විත්තිකරුට විරුඬව නඩුවේ තීන්දුව දියයුතුයි.

11. විත්තිකරු ඒ ඉල්ලීම ඒත්තුනොගත්තොත් සභාපතිතුමාට ඒ ගැන ඔහුගේ උත්තර කියාසිටින ලෙස ඔහුට නියම කළ යුතුයි. එවිට සභාපතිතුමා විසින් ඔහු කියාසිටින උත්තරයේ සාරාංශය ඔහුගේ උත්තරය වශයෙන් නඩුපොතේ සටහන් කරගත යුතුයි.

12. විත්තිකරු තම උත්තරයත් සමග ප්‍රතිවිරුඬ ඉල්ලීමකුත්කර සිටි නම් ඒ ප්‍රතිවිරුඬ ඉල්ලීම තමා ඒත්තුගන්නා නොගන්නා බව කියාසිටීමට පැමිණිලිකරුට නියමකළ යුතුයි. ප්‍රතිවිරුඬ ඉල්ලීම පැමිණිලිකරු ඒත්තුගනී නම්, සභාපතිතුමා විසින් ඒ ඒත්තුගැනීම නඩු පොතෙහි සටහන්කොට ඒ සටහනට අත්සන් කිරීමට, ඔහුට නියමකළ යුතුය. ප්‍රතිවිරුඬ ඉල්ලීම පැමිණිලිකරු ඒත්තුනොගනී නම් ඔහුට ඒ සම්බන්ධයෙන් උත්තරදීමට එවේලේම නියමකළ යුතුය.

13. විත්තිකරුගේ උත්තරය සටහන් කරගත් ඉක්මනින්ම, එසේ නැතහොත් ප්‍රතිවිරුඬ ඉල්ලීමක් ඇතිවිට ඒ ඉල්ලීමට උත්තර දුන් ඉක්මනින්ම සභාපතිතුමා විසින් නඩුව විභාගකිරීම පිණිස දිනයක් නියමකොට ඒ බව නඩුපොතේ සටහන් කළ යුතුය.

14. සභාපතිතුමා විසින් නඩුව ඇසීමේදී හෝ ඊට කලින් පැමිණිලි පාර්ශ්වයේ හෝ විත්ති පාර්ශ්වයේ ඉල්ලීම පිට, නඩුවේ පැමිණිලිකාරයකු මෙන් හෝ විත්තිකාරයකු මෙන් වැරදිලෙස නඩුවට සම්බන්ධවී සිටින අයකුගේ නමක් කපාහැරීමට නියමකළ හැකිසි. නඩුව සම්බන්ධ සෑම ප්‍රශ්නයක්ම සාර්ථක අන්දමින්ද, සම්පූර්ණයෙන්ද, විසඳා බේරුමක් කිරීමට උසාවියට හැකිවීම පිණිස යම් අයකුගේ පැමිණීම අවශ්‍ය වුවහොත් සභාපතිතුමා විසින් ඒ අය නඩුවේ පැමිණිලිකරුවකු හෝ විත්තිකරුවකු මෙන් එකතුකළ හැකිසි. ඒ අය සම්බන්ධයෙන් නඩු මාර්ගයේ ප්‍රකාර ක්‍රියාකිරීම මීට කලින් විධාන කරනලද අන්දමට වේ.

## IV.—උසාවියේ පෙනීනොසිටීමට ක්‍රියාකරන අන්දම.

15. (1) සිතාසියේ සඳහන්වූ දිනයෙහිදී හෝ නඩුව ඇසීමට නියමකළ යම් දිනකදී හෝ පැමිණිලිකරු උසාවියේ පෙනී නොසිටියොත් හෝ එසේ පෙනීනොසිටීම ගැන නිදහසට සෑහෙන පරිදි කරුණු කියානොසිටියොත්, පැමිණිලිකරුගේ නඩුව විසිකරනු ලැබේ. එහෙත් 10 වැනි නියෝගය යටතේ ඉල්ලුම්කර සිටීමට විත්තිකරු පැමිණිලිකරුගේ ඉල්ලීම ඒත්තුගනී නම්, සභාපතිතුමා විසින් පැමිණිලිකරුගේ වාසියට තීන්දුව දී, ඊට අත්සන්කිරීමට විත්තිකරුට නියමකළ යුතුයි.

(2) සිතාසියේ සඳහන්වූ දිනයෙහිදී හෝ නඩුව ඇසීමට නියමකළ යම් දිනකදී හෝ විත්තිකරු උසාවියේ පෙනී නොසිටියොත් එක්කෝ එසේ පෙනී නොසිටීම ගැන තම නිදහසට සෑහෙන පරිදි කරුණු කියානොසිටියොත්, විත්තිකරුට පෙනී සිටීමට නියමකළ සිතාසිය ඔහුට භාරදීමම සාක්ෂියක් කොටගෙන ඒ පැහැරහැරීම නිසා විත්තිකරුට විරුඬව තීන්දුව දිය හැකිසි.

එසේ වුවත්, ඉඩමක අයිතියක්, සම්බන්ධකමක් හෝ ඉඩමක් බුක්තිවිඳීමේ හිමිකමක් පිළිබඳව ආරවුලක් ගැනවූ සියලුම නඩුවලදීද පැමිණිලිකාරයා කියාසිටින අයිතිය ඔප්පුකිරීමට තිබෙන සාක්ෂි ඇසීම අවශ්‍යය කියා හෝ යෝග්‍යය කියා හෝ සභාපතිතුමාට කල්පනාවූනොත්, සභාපතිතුමා විසින් ඒ සාක්ෂි ඇසිය යුතුය. තවද ඒ සාක්ෂි ඇසීමෙන් පසුව එතුමා විසින් ඔප්පුවී තිබෙන සුදුසුකම් උඩ යුක්තියත් උචිතනාකරන පරිදි නඩුවේ තීන්දුව දිය යුතුය. එසේ කිරීමේදී, උසාවියට නොපැමිණ පැහැරහැරීම ගැන කල්පනාවට නොගත යුතුය.

(3) සිතාසියේ සඳහන්කර තිබෙන දිනයෙහි හෝ නඩුව ඇසීමට නියමකර තිබෙන ඕනෑම දවසක නඩුව අඬගැසූවිට දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක්වත් පෙනීනොසිටියොත්, උසාවියේ ඇසන්නට තිබෙන නඩුලේඛනයෙන් නඩුව අස්කර දැමිය යුතුය.

(4) උසාවියට නොපැමිණීම ගැන ආඥාවක් කරනු ලැබූ යම්කිසි පාර්ශ්වකාරයෙක් ඒ ආඥාවෙන් පසුව අනතිදීර්ඝ කාලයක් තුළ, යම්කිසි හදිසි අනතුරක්, අසනීපයක්, අභාග්‍යයක් හෝ පැහැරහැරිය නොහැකි අන්කිසි කරුණක් නිසා තමාට උසාවියට පැමිණීමට නියමව තිබුණු දිනයෙහි පැමිණිය නොහැකිවූ බවද, තමාගේ නඩුව ඇසීමට යුතුකම් ඇති හොඳ නඩුවක් බවද, සභාපතිතුමාට ඒත්තු දුන්නොත්, එවිට ඒ සම්බන්ධයෙන් පැනවිය යුතුය, නිසිය කියා එතුමාට පෙනෙන කොන්දේසි ආදිය නියමකොට කලින් කරනලද ආඥාව අස්කොට, පැමිණීම පැහැරහැරීම පිළිබඳ ආඥාව කළ අවස්ථාවේදී අත්හිටවූනු තැන සිට නැවතත් නඩුවේ වැඩකරගෙන යන ලෙස එතුමා විසින් නියමකළ හැකිවේ.

ඒ සඳහා කරන ඉල්ලීම ප්‍රතික්ෂේපකිරීමේ හෝ ඉඩහැරීමේ ආඥාව තීන්දුවකුත් සමග කළ යුතුය. ඒ ආඥාව කිරීමට කාරණ මේ මේ යයි ඒ තීන්දුවේ සඳහන්කළ යුතුය. ඒ තීන්දුවට විරුඬව ඇපැල් ගැනීමද කළ හැකිවේ.

## V.—නඩුව ඇසීම.

16. (1) නඩුවේ කෙරෙන සියලු කටයුතු සභාපතිතුමා විසින් නඩුපොතේ ලියා තැබිය යුතුයි; පාර්ශ්වකාරයන් හා සාක්ෂිකාරයන් විසින් දිවුරුම් හෝ සහතිකපිට කියනලද සාක්ෂිත් එතුමා විසින් නඩුපොතේ ලිවිය යුතුයි.

(2) එක් එක් දවසේ කෙරෙන කටයුතු සටහන්කරන්නට පටන්ගැනීමේදී ඒ ඒ දවසේ පැමිණ සිටින පාර්ශ්වකාරයන්ගේ නම් සටහන්කළ යුතුයි.

17. (1) සමාදානයෙන් බේරුමක්කර ගැනීමට පාර්ශවකාරයන් අකමැති නම්, සාක්ෂි අසා නඩුව තීන්දුකිරීමට සභාපතිතුමා පටන්ගත යුතුයි. සභාපතිතුමාගේ කල්පනාවේ හැටියට නඩුවේ හරි තීන්දුව රඳාපිටින බවට පෙනෙන දෙපාර්ශවයේ ආරවුලට හේතුවූ ප්‍රධාන කරුණු එතුමා විසින් ප්‍රශ්න වශයෙන් සටහන්කළ යුතුයි. මේ සඳහා පැමිණිලිකාරයාගේ ඉල්ලීම පිළිබඳ සාක්ෂි සහ විත්තිකාරයාගේ උත්තරයද අසාගෙන, දෙපක්ෂයේ ආරවුල නියම වශයෙන් පවතින්නේ කවර ප්‍රශ්න උඩදැයි සොයාගැනීම පිණිස, තවත් ඇසිය යුතුය යි හැගෙන ප්‍රශ්න දෙපක්ෂයෙන්ම හෝ එක් පක්ෂයකින් ඇසිය හැකිවේ. ඉන්පසු නඩුව ඇසිය යුත්තේ පහත සඳහන් පිළිවෙළටය. එනම් :—

(a) දිවුරුම් හෝ සහතිකපිට පැමිණිලිකාරයාගේ සාක්ෂිය;

(b) දිවුරුම් හෝ සහතිකපිට පැමිණිලිකාරයාගේ සාක්ෂිකාරයන්ගේ සාක්ෂි;

(පැමිණිල්ලේ නඩුව වැසීම.)

(c) දිවුරුම් හෝ සහතිකපිට විත්තිකාරයාගේ සාක්ෂිය;

(d) දිවුරුම් හෝ සහතිකපිට විත්තියේ සාක්ෂිකාරයන්ගේ සාක්ෂි ;

(විත්තියේ නඩුව වැසීම.)

(e) නඩු තීන්දුව.

(2) එක් එක් පක්ෂය විසින්, විරුඩ පක්ෂයෙන් හා විරුඩ පක්ෂයේ සාක්ෂිකාරයන්ගෙන් හරස් උත්තර ඇසීමත්, තම පක්ෂයේ සාක්ෂිකාරයන්ගේ සාක්ෂි වරක් අසා නැවතත් ඇසීමත් කළ හැකිවේ.

(3) විත්තිකාරයන් එක්කෙනෙකුට වැඩිගණනක් සිටිත් නම් ඒ එක් එක් විත්තිකාරයා විසින් සාක්ෂි කියා තමාගේ සාක්ෂිකාරයන් ලවාත් සාක්ෂි දෙවා තම තමන්ගේ නඩු වෙන වෙනම වැසිය යුතුය.

(4) සභාපතිතුමාට ඕනෑය කියා කල්පනාවුණොත් පැමිණිලිකාරයකු හෝ විත්තිකාරයකු හෝ සාක්ෂිකාරයකු හෝ නැවතුරව සාක්ෂි ඇසීමට හෝ හරස් උත්තර ඇසීම සඳහා ගෙන්වීම හෝ පාර්ශවකාරයන් විසින් සඳහන් නොකරනලද සාක්ෂිකාරයකු ගෙන්වීම හෝ කළ හැකිවේ.

(5) දෙපක්ෂයෙන් කවර පක්ෂයක් වුවත් සාක්ෂි කීමට හෝ ස්වකීය සාක්ෂිකාරයන් ලවා සාක්ෂි කියවීමට හෝ කැමැත්ත නොදක්වුවොත්, එසේ කිරීමේ අවකාශය ඒ පක්ෂයට දුන් නුමුත් ඒ පිළිනොගත් බවත් නඩු පොතේ සටහන්කළ යුතුවේ.

(6) සභාපතිතුමා විසින් ඕනෑ වේලාවක පාර්ශවකාරයන්ගෙන් හෝ ඔවුන්ගේ සාක්ෂිකාරයන්ගෙන් ඇසීම සුදුසුයයි තමන්ට කල්පනාවෙන ප්‍රශ්න ඇසිය හැකිවේ. තවද උසාවියට පැමිණ සිටින ඕනෑම කෙනෙකු කැඳවා සාක්ෂි කියන ලෙස හෝ ඔහු ළඟ තිබෙන ඕනෑම ලියවිල්ලක් ඉදිරිපත්කරන ලෙස නියමකිරීමද කළ හැකිවේ.

(7) නඩුවේ පාර්ශවකාරයෙක් නොවූද, නඩුවේ එක් පාර්ශවයක් විසින්වත් සාක්ෂිකාරයකු වශයෙන් සඳහන්කරනු නොලැබූද, කවර කෙනෙකුගේ වුවත් සාක්ෂිය ඇසීම අවශ්‍යයයි කවර අවස්ථාවකදී වුවත් සභාපතිතුමාට කල්පනාවුණොත් සභාපතිතුමාගේම කැමැත්තෙන් ඒ තැනැත්තා සාක්ෂිකාරයෙකු වශයෙන් දිනක් සඳහන් කරනලද, සිතාසියක් යවා එදින උසාවියට කැඳවීමද, ඒ දිනදී සාක්ෂිකාරයකු වශයෙන් විභාගකිරීමද කළ හැකිවේ. එක් පාර්ශවයක් විසින්වත් ඉදිරිපත් නොකරන ලද්දාවූ යම්කිසි ලියවිල්ලක් නඩුව තීන්දුකිරීම සඳහා අවශ්‍යයයි සභාපතිතුමාට කල්පනාවුණොත්, ඒ ලියවිල්ල තබාගෙන ඉන්නා අයට සිතාසියක් යවා ඒ ලියවිල්ල ඉදිරිපත්කරවා ගැනීම එතුමා විසින් කළ යුතුය.

## VI.—තීන්දුව හා තීරණය.

18. නඩු විභාගය අවසානවූ වහාම හෝ ඉන්පසු පාර්ශවකාරයන්ට දැනුම්දෙනලද දිනයකදී උසාවියේ කවුරුත් ඉදිරිපිට සභාපතිතුමා විසින් නඩු තීන්දුව කියවිය යුතුවේ.

19. තීන්දුව ඉංග්‍රීසියෙන් ලිය යුතුය. තවද ඒ තීන්දුව කියවනවිට උසාවියේ කවුරුත් ඉදිරිපිට සභාපතිතුමා විසින් එයට දින දමා අත්සන්කළ යුතුය. නඩුවේ ලුහුඬු විස්තරයක්ද, තීන්දුවට භාජනවූ ප්‍රශ්නද, ඒ ගැන දෙනලද විනිශ්චයද, ඒ විනිශ්චයට බැසීමට ඇතිවූ හේතුද, තීන්දුවේ සඳහන්විය යුතුයි. තීන්දුවේ අවසාන කොටසේ (මින්පසු තීරණයයි කියනු ලබන) නියමයක් වශයෙන් ලියන වාක්‍යයක් ඇතිවිය යුතුය. අයැද සිටින සහනය පිළිබඳව සභාපතිතුමාගේ අණෙවිද, යම්කිසි ගාස්තු ගෙවීමක්, නියමකරනු ලැබේ නම්, එයද පැහැදිලි ලෙස ලුහුඩින් ඒ වාක්‍යයෙහි ඇතුළත් විය යුතුයි.

20. තීරණය කරණු ලබන්නේ නිශ්චල දේපල ගැන නම්, ඒ දේපල නිවැරදි ලෙස අඳුනාගත හැකිවන පරිදි ඒ තීරණයෙහි ඒ දේපලවල මායිම් දීමෙන්ද, පිඹුරුකඩදාසි ගැන සඳහන්කිරීමෙන්ද, තවත් අවශ්‍ය තොරතුරු දීමෙන්ද විස්තරකළ යුතුයි.

21. මුදල් ගෙවීමට කරන සියලුම තීරණවලදී, අයවිය යුතු බවට තීරණය කරණලද මුදල කොටස් වශයෙන් ගෙවීමට සභාපතිතුමා විසින් නියමකළ යුතුය. එහෙත් මුලින්ම ගෙවිය යුතු මුදල් කොටස හෝ පසුව ගෙවිය යුතු මුදල් කොටසක් හෝ ගෙවන්නට බැරිවුණොත් එවකට අයවිය යුතුව තිබෙන මුදල හෝ ඉතිරි මුදල එකවර අයකරගත හැකිවිය යුතුයි.

22. පැමිණිලිකාරයා ඉල්ලා ගෙන සිටින මුදලෙන් කොටසක් හිලව්කිරීමට, විත්තිකාරයාට ඉඩදී තිබුණොත් තීරණය දිය යුත්තේ දෙපාර්ශවයෙන් කවර පාර්ශවයකට හෝ අයවිය යුතුයයි පෙනෙන්නට තිබෙන ඉතිරි මුදල අයකරගැනීම සඳහාය. හිලව්කිරීමක් වශයෙන් හෝ හරස් ඉල්ලීමක් වශයෙන් හෝ විත්තිකාරයාට යමක් තීරණයකර දෙනවිට, ඒ සඳහා කරන තීරණය, විත්තිකාරයා විසින් වෙනම නඩුවක් දමා යමක් ඉල්ලුම්කර තිබී ඒ සඳහා කරනලද තීරණයක් මෙන්ම වලංගුවෙනවා පමණක් නොව, ඊට අදාලවන නියෝගවලටද යටත්වෙනවා ඇත.

## VII.—නඩු කල් දැමීම.

23. ආරවුලට භාජනවූ ඉඩම හෝ දෙය සභාපතිතුමා විසින් පරීක්ෂාකිරීම නුවනට හුරුය කියා හෝ අවශ්‍යය කියා හෝ සභාපතිතුමාට කල්පනා වුණොත්, ඒ පරීක්ෂණය පවත්වනතුරු සභාපතිතුමා විසින් නඩුව ඇසීම හෝ අවසාන තීරණය දීම කල්දැමිය හැකිවේ. ඒ පරීක්ෂණය පවත්වන වේලාව සහ තැන කටවචනයෙන් හෝ ලියවිල්ලකින් හෝ පාර්ශවකාරයන්ට සභාපතිතුමා විසින් නියමිත පරිදි දැනුම්දිය යුතුය. තවද පාර්ශවකාරයන්ට පරීක්ෂණය පවත්වන තැන පෙනීසිටීමට හිමිකම් ඇති බව ඒ දැනුම් දීමෙන් සඳහන්විය යුතුය.

24. යම්කිසි වැදගත් සාක්ෂිකාරයකුගේ නොපැමිණීම හේතුකොටගෙන (ඒ සාක්ෂිකාරයා දෙපාර්ශවයම එකඟවූතුව අත්හිටවා ගෙන නැත්නම්ය.) එක්කෝ වෙන සෑහෙන හේතුවක් නිසා, දෙපාර්ශවයෙන් එක්පාර්ශවයක් නඩු විභාගයට සූදානම් නැති බව සභාපතිතුමාට ඒත්තුගොස් තිබෙන විටෙක, සභාපතිතුමා විසින් නඩු විභාගය එක්වරක් හෝ වැඩිවාර ගණනක් අත්හිටවා තැබීමට ඉඩදීම නීතානුකූලවේ, එහෙත්, සභාපතිතුමාට සුදුසුය කියා පෙනේ නම්, පැමිණ සිටින සාක්ෂිකාරයන්ගේ සාක්ෂි විභාගකොට, එක් වැදගත් සාක්ෂිකාරයා ගෙන්වාගන්නාතුරු නඩුව තව දුරට ඇසීම කල්දැමිය හැකිවේ.

25. කවර උසාවියක වුණත් සභාපතිතුමා අසනීපයක් හෝ අන්කිසි හදිසි කරුණක් නිසා නොපැමිණි විටෙක, ඒ උසාවියේ ඇපැල් නඩු ඇසීමට බලය ඇති දිස්ත්‍රික් නඩුකාරතුමා විසින් විශේෂයෙන් බලය දෙනු ලැබ සිටින උසාවියේ ලිපිකරුවකු විසින් සභාපතිතුමා නොපැමිණෙන කාලයට දින දමා තිබෙන සියලුම නඩු අඩගසා විභාග ආදිය වෙන ඕනෑම දිනකට කල්දැමීමට බලය ඇතිවිය යුතුය.

## VIII.—සමාදානයෙන් බේරගැනීම.

26. සභාතිතුමා ඉදිරිපිටදී නඩුවක් පාර්ශවකාරයන් අතර සමාදානයෙන් බේරගනු ලැබූ විටෙක, ඒ බේරගැනීමේ කොන්දේසි නඩුපොතේ සටහන්කිරීම සභාපතිතුමාගේ යුතුකමවේ. තවද එසේ කරනලද සටහන පාර්ශවකාරයන්ට තේරුම් දීමද, පාර්ශවකාරයන් විසින් එය අත්සන්කිරීමද කළ යුතුය. සෑම බේරගැනීමම නඩු තීන්දුවක්සේ බල වලංගු වියයුතුය.

## IX.—ඇපෑල් ගැනීම.

27. (1) උසාවියක නඩු තීන්දුවකට හෝ අවසාන අඥාවකට විරුඩව ගන්නා සෑම ඇපෑලම අඥාපනතේ 41 වැනි වගන්තියේ සඳහන්වූ කාලසීමාව තුළ ඇපෑල්කාරයා හෝ ඇපෑල්කාරයන් විසින් හෝ ඒ ඒ කාරණයට යෙදෙන හැටියට අත්සන් කරනලද පෙත්සම් ලියවිල්ලකින් සභාපතිතුමාට ඔප්පුකළ යුතුය. ඒ පෙත්සම පැහැදිලි ලෙස ලිය යුතුය. එහි පහත සඳහන් කරුණු සඳහන් විය යුතුය:—

(i.) නඩුව දමා තිබෙන උසාවියේ නම;
(ii.) නඩුවේ නොම්මරය;
(iii.) නඩුවේ පාර්ශවකාරයන්ගේ නම් සහ ඇපෑල් ගන්නා පාර්ශවකාරයා කවරෙක්ද යන වග;
(iv.) නඩුව පිළිබඳ ලුහුඩු විස්තරයක් හා ඇපෑල් ගැනීමට ඇති කරුණු;
(v.) ඉල්ලා සිටින සහනයේ ස්වභාවය.

(2) අඥාපනතේ 47 වැනි වගන්තියේ නියමිත පරිදි මුද්දර ගසා නැති සෑම පෙත්සමම පෙත්සම්කාරයාට ආපසු දෙනු ලැබේ.

(3) ඇපෑල් පෙත්සම සභාපතිතුමාට ඔප්පුකළවිට එතුමා විසින් එහි ගසා තිබෙන මුද්දරය අවලංගුකොට එය නඩු පොතත් සමග දිස්ත්‍රික් නඩුකාරතුමා වෙත යවනු ලැබේ.

(4) ඇපෑල් පෙත්සම යවනවිට ඒ පෙත්සම ලැබුණේ අසවල් දිනය යි පෙත්සම් උඩම සහතිකකළ යුතුය.

## X.—නඩු පොත්.

28. මීට යාකොට තිබෙන උප ලේඛනයේ 3 වැනි ෆෝර්මයෙහි නඩු පිළිබඳ ලේඛනයක් සභාපතිතුමා විසින් තැබිය යුතුය. තවද උසාවියේ ඇපෑල් නඩු ඇසීමට බලය ඇති දිස්ත්‍රික් නඩුකාරතුමා වෙත එක් එක් මාසය අගදී ඒ ඒ මාසය තුළ කෙරුණු වැඩ එකී උප ලේඛනයේ 4 වැනි ෆෝර්මයෙහි සඳහන්කොට සවිස්තර ලේඛන වාර්තාවක් යැවිය යුතුය.

29. උසාවියක පවරනලද ඕනෑම සිවිල් නඩුවක නඩු පොත හෝ එහි දිනපත්‍ර කළ කටයුතු සටහන ඒ ඒ අවස්ථාවේදී භාරයේ තබාගැනීම ගැන වගකිව යුතු උසාවියක සභාපතිතුමකු විසින් හෝ දිස්ත්‍රික් නඩුකාරතුමකු විසින් ඕනෑම කෙනෙකුගේ ඉල්ලීමක්පිට, ඔහුට ඒ නඩු පොතේ හෝ එහි දිනපත්‍ර සටහනේ එක්කෝ ඉන් කවර කොටසක වුවත් පිටපතක් වචන 120යින් යුත් ෆෝලියෝ පිටුවකට සත 12 බැගින් ගාස්තුවක් ගෙවනු ලැබූවිට දිය යුතුය. එහෙත් යම් කිසිවකුට යම්කිසි හේතුවක් නිසා එබඳු පිටපතක් නොමිලයේ දිය යුතුයයි සභාපතිතුමාට හෝ දිස්ත්‍රික් නඩුකාරතුමාට කල්පනාවුණොත් එසේ දීමට බලය ඇත්තේය.

## XI.—සිතාසි ආදියෙහිද දිනපත්‍ර සටහන්වලද නඩු පොත්වලද ව්‍යවහාර කළයුතු භාෂාව.

30. කවර උසාවියකින් වුවත් නිකුත්කරනු ලබන සිතාසි ආදිවූ සෑම ලියවිල්ලම ඒ උසාවියේ කටයුතු කරන භාෂාවෙන් විය යුතුය.

31. කවර උසාවියක වුවත් නඩු රෙජිස්ටර් පොතත් හැම නඩුවේම නඩු පොතත් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා තැබිය යුතුයි.

## XII.—බාල වයස්කාරයන් විසින් හෝ බාල වයස්කාරයින්ට විරුඩව පවරන නඩු හා කරන වෙනත් කටයුතු.

32. බාල වයස්කාරයකු විසින් හෝ බාල වයස්කාරයකුට විරුඩව හෝ පවරන නඩුවක් හෝ කරන නීති මාර්ගයේ ක්‍රියාවක් ඒ බාල වයස්කාරයාගේ දේපල සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 582 වැනි වගන්තිය යටතේ කියුරේටර් සහතික පත්‍රයක් දෙනු ලැබ සිටින කෙනෙකු විසින් පැවරීම හෝ කිරීමත් ඒ බාල වයස්කාරයා වෙනුවෙන් පෙනීසිට ඔහුගේ හිමිකම් ආරක්ෂාකිරීමත් කළ යුතුය. බාල වයස්කාරයෙකුගේ දේපල භාරව සිටීමට කියුරේටර් බලකාරයෙකු පත්කරනු ලැබ නොසිටින අවස්ථාවක් වූවිට, ඒ බාලවයස්කාරයාට විරුඩව හෝ ඒ බාලවයස්කාරයා වෙනුවෙන් පවරනු ලබන නඩුවක් හෝ කරනු ලබන නීති මාර්ගයේ ක්‍රියාවක් ඔහු වෙනුවෙන් පැවරීම හෝ කිරීමත් ඔහුගේ නමින් සංරක්ෂණ කටයුතුකිරීමත් ඒ සඳහා සභාපතිතුමා විසින් පත්කරනු ලබන වෘඩයකු විසින් කළ හැකිවේ.

එහෙත් පඩි වශයෙන් හෝ කුලී මිමිමේ වැඩට හෝ මෙහෙකරුවකු වශයෙන් කරනලද වැඩට හෝ ශිල්පියකු වශයෙන් හෝ කම්කරුවකු වශයෙන් කරනලද වැඩට ලැබියයුතු මුදල් අයකරගැනීම සඳහා ඕනෑම නඩු මාර්ගයේ කටයුත්තක් කිරීමට බාල වයස්කාරයකුටද වයස් සම්පූර්ණවූවකුට මෙන් බලය ඇත්තේය.

## XIII.—නඩුවක පාර්ශවකාරයකු මැරුණු පසු නඩුවේ කටයුතු කරගෙනයෑම.

33. පැමිණිලිකාරයෙක් හෝ විත්තිකාරයෙක් මැරුණු පසුත් නඩුව කියාගෙනයෑමේ අයිතිවාසිකම පවතීනම්, ඉන් එක්කෙනෙකුගේ මරණය නඩුව අවසන්කිරීමට හේතුවක් නොවිය යුතුය.

34. පැමිණිලිකාරයන් හෝ විත්තිකාරයන් එක්කෙනෙකුට වැඩි ගණනක් සිට ඉන් කවරකු හෝ මැරුණොත් ඉන්පසු නඩුව කියාගෙන යෑමේ අයිතිය ඇතිවන්නේ ජීවත්ව ඉන්නාවූ පැමිණිලිකාරයාට හෝ පැමිණිලිකාරයන්ට පමණක් නම් එක්කෝ ජීවත්ව සිටින විත්තිකාරයාට හෝ විත්තිකාරයන්ට විරුඩව පමණක් නම් සභාපතිතුමා විසින් ඒ ජීවත්ව සිටින පැමිණිලිකාරයාගේ හෝ පැමිණිලිකාරයන්ගේ ඕනෑකම පිට හෝ ඒ ජීවත්ව සිටින විත්තිකාරයාට හෝ විත්තිකාරයන්ට විරුඩව නඩුව විභාගකළ හැකිවේ.

35. පැමිණිලිකාරයන් එක්කෙනෙකුට වැඩි ගණනක් සිට, ඉන් කවරකු හෝ මැරුණොත් ඉන්පසු නඩුව කියාගෙන යෑමේ අයිතිය ඇතිවන්නේ ජීවත්ව ඉන්නාවූ පැමිණිලිකාරයාට හෝ පැමිණිලිකාරයන්ට පමණක් නොව ඔවුන්ටත් මැරුණු පැමිණිලිකාරයා වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින අයටත් නම්, නම් එසේ නීත්‍යානුකූලව පෙනීසිටින අයකුත් ඇත්නම්, සභාපතිතුමා විසින් ඔහුත් නඩුවේ පාර්ශවකාරයකු කිරීමට සලස්වා ඒ බවට නඩුවේ සටහනකුත් කරවා, නඩුවේ කටයුතු කරගෙන යාහැකි වේ.

36. නඩුවේ ඉන්නා එකම පැමිණිලිකාරයා හෝ එකම ජීවත්ව සිටින පැමිණිලිකාරයා මළොත්, ඉන්පසු නඩුව කියාගෙන යෑමේ අයිතිය පවතීනම්, ඔහු වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින අය විසින් තමාගේ නම නැසීගිය පැමිණිලිකාරයාගේ නම වෙනුවට නඩු පොතේ ඇතුළත්කරන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලුම්කර සිටිය හැකිවේ. එසේ ඉල්ලීමක් කළ විටෙක ඔහුගේ නම නඩු පොතේ ඇතුළත්කොට නඩුවේ කටයුතු කරගෙන යා යුතුය.

37. නැසීගිය පැමිණිලිකාරයා වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින්නෙක්මැයි කිසිවකු විසින් කියාසිට 36 වැනි ව්‍යවස්ථාව යටතේ ඉල්ලීමක් සභාපතිතුමාට නොකළොත්, එතුමා විසින් නඩුව විසිකළ හැකිවේ. එක්කෝ, විත්තිකාරයාගේ ඉල්ලීම පිට, සභාපතිතුමාට හරිය කියා හිතුණොත් නැසීගිය පැමිණිලිකාරයා වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින්නා නඩුවට ඇතුළත් කිරීම සඳහා හෝ අරවුලකට භාජනවූ කාරණය අවසාන වශයෙන් නිශ්චයක්කිරීම පිණිස නඩුවේ කටයුතුකිරීම සඳහා හෝ ඒ කාරණ දෙකම සඳහා හෝ සභාපතිතුමාට සුදුසුය කියා හිතෙන අඥාවක් කළ හැකිවේ.

38. (1) විත්තිකාරයන් එක්කෙනෙකුට වැඩිය සිට නඩුවේ තීරණයට ප්‍රථමයෙන් ඉන් කවරකු හෝ නැසීගොස් ජීවත්ව සිටින විත්තිකාරයාට හෝ විත්තිකාරයන්ට විරුඩව නඩුව කියාගෙනයෑමේ අයිතිය නොපවතීනම්ද, එකම විත්තිකාරයකු හෝ එකම ජීවත්ව සිටින විත්තිකාරයකු සිට නැසීගොස් නඩුව කියාගෙන යෑමේ අයිතිය පවතිනා විටෙකද, නැසීගිය විත්තිකාරයා වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින තැනැත්තායයි පැමිණිලිකාරයා විසින් නම්කරනු ලබන්නාවූද, නැසීගිය විත්තිකාරයා වෙනුවට විත්තිකාරයා කිරීමට පැමිණිලිකාරයාට ඕනෑකරන්නාවූද, කවරකුගේ හෝ නම, විස්තරය හා පදිංචි ස්ථානය සඳහන්කොට ඉල්ලීමක් පැමිණිලිකාරයා විසින් සභාපතිතුමාගෙන් කළයුතුය. එසේ ඉල්ලීමක් කළවිටෙක ඒ ඉල්ලීමට කරුණු ඇතැයි සභාපතිතුමාට ඒත්තු ගියොත් එකී නීත්‍යානුකූලව පෙනීසිටින්නාගේ නම නැසීගිය විත්තිකාරයාගේ නම වෙනුවට නඩු පොතේ ඇතුළත්කොට පැමිණිල්ලට විරුඩව කටයුතුකිරීම සඳහා සිතාසියක් එහි සඳහන්වූ දිනෙක උසාවියේ පෙනීසිටින ලෙස ඔහුට නිකුත්කළ යුතුය. එතැන් පටන් එකී නීත්‍යානුකූලව පෙනීසිටි අය නඩුවේ මුලදීම, විත්තිකාරයකුව සිට නඩුවේ කලින් සිදුවූ කටයුතුවලට පාර්ශවකාරයකුව සිටියාක්මෙන් සලකා කටයුතු කළ යුතුය. යම් කිසිවෙකු එසේ නඩුවේ විත්තිකාරයකු කරනුලැබූවිට, ඔහු විත්තිකාරයකු කරනු ලැබීමට යවත් නැති බව උසාවියේ කියාසිටීම හෝ නඩුවේ විත්තියේ වාසියට ඇති කරුණු උඩ විත්තිය වෙනුවෙන් කටයුතු කිරීම කළ හැකිවේ.

(2) නැසීගිය විත්තිකාරයකු වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනී සිටින අයකු විසින් ඒ නැසීගිය විත්තිකාරයා වෙනුවට තමා විත්තිකාරයකු කරනලෙස ඉල්ලුම්කළ හැකිවේ. එසේ කළවිට ඔහු එසේ නඩුවට ඇතුළත්කරනු ලැබීමට හිමිකම් ඇති අයකු නම් සභාපතිතුමා විසින් ඔහු විත්තිකාරයකු කළ හැකිවේ.

## XIV.—ඇස්කිසි.

### (a) ඇස්කිසි ලියවිල්ලක් ඉල්ලුම්කිරීම.

39. (1) තීරණය ක්‍රියාවේ යෙදීමට ඇස්කිසි ලියවිල්ලක් ඉල්ලන හැම ඉල්ලුම්පත්‍රයම ලියා ඉල්ලුම්කරු විසින් අත්සන්කොට පහත සඳහන්වන කරුණුත් සඳහන්කොට දියයුතුය. ඒ කරුණු නම්:—

(a) නඩුවේ නොම්මරය;
(b) පාර්ශ්වකාරයන්ගේ නම්;
(c) තීරණයේ දිනය;
(d) තීරණයට විරුද්ධව ඇපෑලක් ගෙන තිබේද ? යන වග;
(e) තීරණය ප්‍රකාර ණය මුදල් ගණන හෝ අයවියයුතු වන්දි මුදල හෝ තීරණයෙන් දෙනලද වෙනත් සහන;
(f) නඩු ගාස්තුව දී තිබේනම්, ඒ දී තිබෙන ගාස්තු ගණන
(g) යම් අයකුට විරුද්ධව තීරණය ක්‍රියාවේ යොදවා බල පැවැත්විය යුතුනම්, ඔහුගේ නම.

(2) ඇපෑල් ගැනීමට ඉඩදී තිබෙන කාලසීමාව නිමවනතුරු එක්කෝ ඇපෑලක් ගෙන තිබේනම්, ඒ ඇපෑලේ තීන්දුවක් කරනතුරු (1) වෙනි ඡේදය යටතේ කරන ඉල්ලීමක් නොපිළිගත යුතුය.

40. (1) උසාවියේ අවසාන තීරණය හෝ ආඥාව කිරීමෙන් පසු එක් අවුරුද්දකුත් එක් දවසක් ඇතුළත, එක්කෝ ඇපෑලක් ගෙන තිබේනම්, ඒ ඇපෑලේ තීන්දුව ඇපැල්කරුට දැනුම්දීමෙන් පසු එක් අවුරුද්දකුත් එක් දවසක් ඇතුළත, සභාපතිතුමා විසින් අවශ්‍යනම්, නඩු පොත බලා, ඉල්ලුම්පත්‍රය ව්‍යවස්ථානුකූල බවත්, තීරණය හෝ ආඥාව ක්‍රියාවේ යෙදවීම සඳහා ඇස්කිසියක් ලබාගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් ඇති බවත් හරිහැටියට දැනගෙන මීට යාකොට තිබෙන උප ලේඛනයේ 5 වැනි ෆෝර්මයේ ඇස්කිසි ලියවිල්ලක් පිස්කල්තුමා වෙත යැවිය යුතුයි.

(2) එකී දිනෙන් පසු, එක් අවුරුදු එක් දවසේ කාලසීමාව ගතවූ නුමුත් දහ අවුරුදු කාලසීමාව ඇතුළත 39 වැනි ව්‍යවස්ථාව යටතේ ඉල්ලුම්පත්‍රයක් කර තිබේනම්, සභාපතිතුමා විසින් ඒ ඉල්ලීම ගැන නොතීසියක් නඩු තීන්දුව ප්‍රකාර ණයකාරයා වෙත යවා ඇස්කිසි ලියවිල්ල නිකුත් නොකිරීමට හේතු එකී නියමකරනලද දිනක දැක්වීමට ඔහුට නියමකළ හැකිවේ. එකී ණයකාරයා විසින් සෑහෙන පමණ කරුණු නොපෙන්නුවොත්, සභාපතිතුමා විසින් ඉහත සඳහන් ප්‍රකාර ඇස්කිසි ලියවිල්ලක් නිකුත්කළ යුතුවේ.

41. එක්කෙනෙකුට වැඩි ගණනක් අයට හවුලේ වාසිවන අන්දමින් තීරණයක් දී තිබෙන විටෙක, ඔවුන්ගෙන් එක්කෙනෙක් හෝ වැඩිදෙනෙක්, එක්කෝ ඔහු වෙනුවෙන් හෝ ඔවුන් වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින්නන් විසින් ඒ සියල්ලන්ගේම ප්‍රයෝජනය සඳහා එක්කෝ ඉන් කිසිවකු නැසීගොස් සිටීනම් ජීවත්ව සිටින අයගේද, නැසීගිය අය වෙනුවෙන් අයිතිකම් කියාසිටින අයගේද ප්‍රයෝජනය සඳහා ඒ සම්පූර්ණ තීරණය පිළිබඳව ඇස්කිසිය ඉල්ලාසිටීම කළ හැකිවේ.

එබඳු ඉල්ලීමක් කර තිබෙන අවස්ථාවක සභාපතිතුමා විසින් හවුලේ තීරණලාභීන්ට හෝ ඔවුන් වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින්නන්ට නොතීසි යවා ඒ නොතීසිවල නියමකර තිබෙන දිනක ඒ ඉල්ලීම ඉෂ්ටනොකිරීමට ඇති හේතු දක්වන ලෙස නියම කළ යුතුය.

42. තීරණලාභියා විසින් ඒ තීරණය අන් කිසිවකුට සින්නකොට දී තිබේනම්, එය සින්නයේ ලැබූ අය විසින් එය ඇස්කිසි මගින් ක්‍රියාවේ යොදවනලෙස ඉල්ලා සිටිය හැකිවේ. එසේ කළවිට, තීරණ ලියවිල්ලේ සින්නකොට දෙන්නාගේ නම වෙනුවට සින්නයේ ගත් අයගේ නම යෙදිය හැකිවේ. තවද මුල් තීරණලාභියා විසින් ඉල්ලීම කරනුලැබූවිට තීරණය ක්‍රියාවේ යොදවන අන්දමින්ම ඒ කොන්දේසි යටතේම ඇස්කිසිය පිටකළ හැකිවේ.

43. තීරනය සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවා නිමවන්නට පෙර තීන්දුව ප්‍රකාර ණයකාරයා නැසීගියොත්, ඔහු වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින අයට විරුද්ධව තීරණය ක්‍රියාවේ යොදවන ලෙස තීරණලාභියා විසින් ඉල්ලුම් කළ හැකිවේ.

එබඳු ඉල්ලීමක් කර තිබෙන විටෙක, නැසීගිය අය වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනීසිටින අයට සභාපතිතුමා විසින් ඒ ඉල්ලීම ගැන නොතීසියක් එහි නියමකරනලද දිනක ඒ ඉල්ලීමට ඉඩ නොදීමට ඇති කරුණු දක්වන ලෙස නියෝගකොට යැවිය යුතුය.

ඒ නීත්‍යානුකූලව පෙනීසිටින අය ණය ගෙවීමට යටත්වන්නේ නැසීගිය අයගේ දේපල තමා අතට පැමිණ සම්පූර්ණයෙන් අත්සතු නොකොට ඉතිරිව තිබුණු ප්‍රමාණයට සරිලන තරමින් පමණකි.

මේ නියෝගය සඳහා "නීත්‍යානුකූලව පෙනීසිටින්නා" යන්නෙන් අදහස් කරනු ලබන්නේ පොල්මක්කාරකු හෝ අද්මිනිස්ත්‍රාසි බලකාරයකු සහ නියමිත පරිදි පත්කරනලද පොල්මක්කාරයකු හෝ අද්මිනිස්ත්‍රාසි බලකාරයෙකු නැති විටෙක, නැසීගිය අයගේ දේපළ උරුමව සිටින ඒලග ඥාතියා හෝ ඥාතියෝත්ය.

44. (1) තීරණය ක්‍රියාවේ යෙදවීම සඳහා ඇස්කිසියක් ඉල්ලුම්කරනු ලැබ නිකුත්කොට තිබියදී, ඒ තීරණයම ක්‍රියාවේ යෙදවීම සඳහා ඉන්පසු ඉල්ලුම්කරනු ලැබූවිට, ඊට කලින් ඉඩදෙනලද අන්තිම ඉල්ලීමපිට දුන් ඇස්කිසිය සම්බන්ධයෙන් තීරණය සම්පූර්ණයෙන් ඉෂ්ටකිරීම සඳහා කටයුතු සියල්ලම අවශ්‍ය පරිදි කිරීමට උත්සාහකර තිබෙන බවට හෝ තීන්දුව ප්‍රකාර ණයකාරයාගේ ඉල්ලීමපිට තීරණලාභියා විසින් ඇස්කිසියේ කටයුතු නතරකර තිබෙන බවට හෝ සභාපතිතුමාට ඒත්තුගියොත් මිස නැත්නම්, එකී පසු ඉල්ලීමට ඉඩනොදිය යුතුය. තවද පහත සඳහන්වන දිනවලින් කවර එකක සිට හෝ දස අවුරුද්දක් ගතවූ පසු, එසේ පසුව කරන ඉල්ලීමකට අවසර නොදිය යුතුය. එනම්:—

(a) ක්‍රියාවේ යෙදවීමට ඕනෑකරනලද තීරණයේ දිනය එක්කෝ ඇපෑලේදීත් ඒ තීරණයම ස්ථිරකිරීමේදී අලුත තීරණයක් කර තිබේනම් ඒ තීරණයේ දිනය;

(b) තීරණයෙන් හෝ පසුව කරනලද ආඥාවකින් මුදල් ගෙවීමක් හෝ දේපල බාරදීමක් යම්කිසි නියමිත දිනක කිරීමට නියම කොට තිබෙන අවස්ථාවක ඒ මුදල් ගෙවීම හෝ යම් දේපලක් සම්බන්ධයෙන් තීරණය ක්‍රියාවේ යෙදවීමට ඉල්ලුම් කරු ඕනෑකම්කර සිටිනම් ඒ දේපළ බාරදීම හෝ පැහැර හරින්නට යෙදුණු දිනය.

(2) එකී දස අවුරුදු කාලය ගතවීමෙන් පසු තීරණයක් ක්‍රියාවේ යෙදවීමට ඉල්ලීමක් කළොත් ඒ ඉල්ලීමට පෙරටුව ගතවූ දස අවුරුදු කාලය තුළ කවර කාලයකදී වුවත් තීන්දුව ප්‍රකාර ණයකාරයා විසින් වංචාවෙන් හෝ බලයෙන් හෝ තීරණය ක්‍රියාවේ යෙදවීම වලක්වා තිබුණේ සභාපතිතුමා විසින් ඒ ඉල්ලීමට ඉඩදීම මේ නියෝගයේ කිසිවකින් නොවැළකෙන්නේය.

### (b) තීරණය ක්‍රියාවේ යෙදවීම.

45. පිස්කල්තුමාට ඇස්කිසි ලියවිල්ලක් ලැබුණුවිට, එතුමාට එය බාරදී පැ හතලිස්අටක් ඇතුළතද, ණයකාරයා පිස්කල් තුමාගේ කාර්යාලයෙන් සැතපුම් පහකට ඈතින් පදිංචිව සිටින කෙනෙක් නම්, ඉන් එහා එක් එක් සැතපුම් පසේ දුර ප්‍රමාණයට හෝ ඉන් කොටසකට පැ හතලිස්අටක් බැගින් කල්ගෙන, ඒ කාලය ඇතුළත ඔහු පදිංචි ගෙදරට හෝ ස්ථානයට ගොස් ඔහු එහි සිටියහොත් ඇස්කිසි ලියවිල්ලේ සඳහන් මුදල ගෙවනලෙස ඔහුගෙන් ඉල්ලුම්කළ යුතුය. ණයකාරයා නොසිටි නිසා ණය මුදල ගෙවන ලෙස ඉල්ලුම්නොකළොත්, එක්කෝ ඒ ඉල්ලීම කරනු ලැබූවිට එය ඉෂ්ටනොකළොත් පිස්කල්තුමා විසින් ණයකාරයා සතුව තිබෙන්නාවූද අනුන් විසින් අයිතිකම් නොකියන්නාවූද විකිණීම සඳහා ණයකාරයා විසින්ම පෙන්නාදෙනු ලබන්නාවූද ඔහු එසේ කිරීමට පැහැරහැරිය විටෙක තීන්දුව ප්‍රකාර මුදල් හිමියා විසින් පෙන්නාදිය හැකිවූද, එසේ නැතහොත් ඇස්කිසි ලියවිල්ලේ සඳහන්කොට තිබෙන්නාවූද දේපළ අල්ලා තහනමට ගෙන විකුණා හෝ අන්කිසි විධියකින් මුදල්කොට අයකරගැනීම සඳහා කටයුතු කළ යුතුය.

46. නඩුතීන්දුවක ණයකාරයකු සතුවූ දේපළ චංචල වුනත් නිශ්චල වුනත් ඔහුගේම නමින් තිබුණත්, අන්‍යයකු විසින් විශ්වාසයපිට හෝ ඔහු වෙනුවට තබාගෙන තිබුණත්, ඒ සියළුම දේපළද ඔහුට අයවියයුතු සියලු ණයවල්ද, ඇස්කිසියකට අල්ලාගනු ලැබීමට යටත්ය. එහෙත් ඒ ණයකාරයාට විරුද්ධව තිබෙන ඇස්කිසියේ ඕනෑකම ඉෂ්ටකරලීම සඳහා ණයකාරයා විසින් බාරදෙනලද අනුන් අයිතිකම්නොකියන චංචල දේපළ ප්‍රමාණ වේනම්, නිශ්චල දේපළ තහනමට නොගත යුතුය. තවද පිස්කල් තුමා විසින් පහත සඳහන්වන දේපළද, ඇස්කිසියක් පිට අල්ලා තහනමට නොගත යුතුය. ඒවා නම්:—

(a) තීන්දුවේ ණයකාරයාගේ දිවිපෙවෙත සඳහා අවශ්‍ය දේ වශයෙන් සභාපතිතුමාට කල්පනාවෙන ඔහුගේ රක්ෂාව හෝ ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් පාවිච්චිකරන මෙවලම්, භාජන, උපකරණ හෝ ගවයන් යන කිසිවක්ද;
(b) තීන්දුවේ ණයකාරයාගේ ඇඳුම් පැළඳුම්ද;
(c) කම්කරුවන්ගේ හෝ ගෙදරක මෙහෙකරුවන්ගේ පඩිද;
(d) ආණ්ඩුවේ සේවකයකුගේ පඩියද;

යන මේවාය.

(c) අල්ලා තහනමට ගන්නා පිළිවෙළ.

47. අල්ලා තහනමට ගැනීමට තිබෙන දේපළ නිශ්චල දේපළ නම්, ඒ දේපළ තීන්දුවේ ණයකාරයා විසින් සින්නක්කරදීම හෝ අන්කිසි විධියකින් බැඳීම හෝ බරකට යටකිරීමද ඔහුගෙන් කිසිවකු විසින් මිළයට හෝ තෑගි වශයෙන් හෝ අන්කිසි විධියකින් හෝ ඒ දේපළ ලබාගැනීමද තහනම්කොට නොතීසියක් ඉඩමේ කොටත් පෙනෙන තැනක ගැසීමෙන් පිස්කල්තුමා විසින් නිශ්චල දේපළ අල්ලා තහනමට ගත යුතුය. ඒ නොතීසිය මීට යාකරණලද උප ලේඛනයේ 6 වැනි පෝර්මයේ අඩංග සම්පූර්ණව තිබිය යුතුය.

48. අල්ලා තහනමට ගත්ට තිබෙන දේපළ තීන්දුවේ ණයකාරයා සතු චංචල දේපළ වේනම්, ඒවා පිස්කල්තුමා විසින් අතින් අල්ලා තහනමට ගෙන ඒවා තමන්ගේ භාරයට ගතහැකිනාක් ගතයුතුය.

49. තීන්දුවේ ණයකාරයා ලඟ නැති චංචල දේපළ අල්ලා තහනමට ගැනීමට ඔනෑවූ විටෙක, මීට යාකරණලද උප ලේඛනයේ 7 වැනි පෝර්මයේ අඩංග සම්පූර්ණකොට ලියනලද තහනම් පත්‍රයක් උසාවියේ කොටත් පෙනෙන තැනක අලවා එහි පිටපතක් ඒ දේපළ ලඟ තබාගෙන ඉන්නා අයට භාරදීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් අල්ලා තහනමට ගැනීම කළ යුතුය. ණය මුදල් අල්ලා තහනමට ගැනීමට ඔනෑවූ විටෙක, මීට යාකරනලද උප ලේඛනයේ 8 වැනි පෝර්මයේ අඩංග සම්පූර්ණකොට ලියනලද අල්ලා තහනමට ගැනීමේ නොතීසියක් උසාවියේ කොටත් පෙනෙන තැනක අලවා එහි පිටපතක් බැගින් එක් එක් ණයකාරයාට භාරදීමෙන් හෝ තැපෑලෙන් යැවීමෙන් අල්ලා තහනමට ගැනීම කළ යුතුය.

50. යම්කිසි දේපළක් ඇස්කිසියක් පිට නියමිත පරිදි අල්ලා තහනමට ගත් පසුද, ලියා යවන තහනම් පත්‍රයකින් දේපළක් අල්ලා තහනම්කරන අවස්ථාවක ඉහතකී ප්‍රකාර තහනම්කිරීම ගැන නියමිත පරිදි දැනුම්දෙනු ලැබූ පසුද, අල්ලා තහනමට ගත් දේපළ, සින්නක්කර විකිණීමෙන් හෝ තෑගිදීමෙන් හෝ, උකස්කිරීමෙන් හෝ අන්කිසි විදියකින් හෝ අන්සතුකිරීමක් හෝ බැඳීමක් (මෙහි පහත නියමකරනලද පරිදි පිස්කල්තුමා විසින් හෝ එතුමාගේ අණප්‍රකාර කරනුලබන අන්සතුකිරීම් ආදියක් හැරයි) කරනු ලැබුවොත් එයද තහනම පවතින කාලය තුළ තීන්දුවේ ණයකාරයාට ණය මුදල හෝ ණය මුදල් ගෙවීමක් කළොත් එයද අවලංගු වන්නේය.

51. ණයකාරයකු විසින් ණය හිමියාට ණය මුදල් ගෙවීම තහනම්කොට, ඇති සෑම අවස්ථාවකම ණයකාරයා විසින් ඒ ණය මුදල පිස්කල්තුමාට ගෙවිය හැකිවේ. ඒ ගෙවීම ණය හිමියාට කරණලද ගෙවීමක් මෙන්ම වලංගු වන්නේය.

52. පිස්කල්තුමා විසින් යම්කිසි දේපළක් තහනමට ගත් විගසම ඒ දේපළවල ලැයිස්තුවක් සාදා එතුමා විසින් හෝ ඒ දේපළ තහනමට ගත් අය විසින් හෝ වහාම අත්සන්කොට, ඒ තහනමට ගත් දේපළ තබාගෙන ඉන්නා අයට භාරදිය යුතුය. එසේනොව, ඒ දේපළ තබාගෙන ඉන්නා අයෙකු නැත්නම්, ඒ තහනම කරන්ට යෙදුන කොටසේ ගම් මූලාදෑනිතැනට භාරදිය යුතුයි. එසේ ලැයිස්තුව භාරදී, ඒ ලැයිස්තුවේ පිටපත් සාදා එකක්, පිස්කල්තුමාගේ කාර්යාලයේ තබා ඇස්කිසිය පළිබඳව උසාවියට යවන වාර්තා ලේඛනයට එකක් ඇමිණිය යුතුයි.

53 යම් දේපළක ආරක්ෂාව සැලැස්වීමට සෑහෙන ක්‍රමයක් නැති ස්ථානවල තිබී ඒ දේපළ අල්ලා තහනම්කරනු ලැබූ අවස්ථාවෙක, පිස්කල්තුමා විසින්, ඒ දේපළ සුරක්ෂිතව තැබීමට සුදුසු ස්ථානයකට ගෙනයෑමට සැලැස්වීම හෝ ඒ දේපළ විකුණනු ලබනතුරු සුරක්ෂිතව තබාගන්නා බවට ඒ දේපළ අයිතිකාරයා හෝ ලඟ තබාගෙන ඉන්නා අය විසින් පිස්කල්තුමාට සෑහේයයි කල්පනාවෙන ඇපයක් දුන්විට ඒ අයට භාරදී තැබීම හෝ කළහැකි වේ. ඒ දේපළ අයිතිකාරයා හෝ ලඟ තබාගෙන ඉන්නා අය එසේ ඇපයක් දෙන්නට නොයෙදුනොත්, ඇස්කිසියේ ඉල්ලුම්කරනු පාර්ශවකාරයා විසින් එසේම පිස්කල්තුමාට සෑහේයයි කල්පනාවෙන ඇපයක් දුන්නොත්, ඒ අයට ඒ දේපළ සුරක්ෂිතව තබාගැනීමට නියමකොට භාරදිය හැකිවේ. එසේ නියම්කරනු ලැබූවිට, ඒ ඇස්කිසිය ඉල්ලුම්කරනු පාර්ශවකාරයා ඒ දේපළ භාරගන්නට හෝ එසේ ඇපයක් දෙන්නට හෝ නොයෙදුනොත් පිස්කල්තුමා විසින් ඒ ගැන විශෙෂ වාර්තාවක් සභාපතිතුමා වෙත යැවිය යුතුය. ඉන්පසු ඒ දේපළට සිදුවන යම්කිසි හානියක් හෝ නැතිවීමක් හෝ අලාභයක් ගැන ඉන්පසු වග නොකියන්නේය.

(d) තහනම අස්කර ගැනීම.

54. තීරණය ඉෂ්ටකරනුලැබ තිබෙන විටෙක, තහනමට ගෙන තිබෙන දේපළ සම්බන්ධයෙන් හිමිකම් දක්වන කවරකුගේ හෝ ඉල්ලීම පිට තහනම අස්කරන ලෙස සභාපතිතුමා විසින් පිස්කල්තුමාට අණවක් යැවිය යුතුය.

(e) දේපල විකිණීම.

55. නියමිත පරිදි දේපළ අල්ලා තහනමට ගත් පසු පහත සඳහන් ප්‍රකාර ඒ දේපළ විකිණීම සඳහා පිස්කල්තුමා විසින් කටයුතු කළ යුතුය:—

(i.) චංචල දේපළ තහනමට ගත් සෑම අවස්ථාවලම ඒවා විකුණනුලබන බව, විකුණන ස්ථානයේත් අල්ලා තහනමට ගත් තැනැත් අණබෙර ගැසීමෙන් හෝ අන්කිසි අනුමකින් හෝ ඒ විකිණීම ප්‍රසිද්ධකිරීමෙන් දැනුම්දීමට සැලැස්විය යුතුයි. තවද, ඒ දැන්වීමෙන් දෙන කාලසීමාව සභාපතිතුමාගේ යම්කිසි අණකින් වැඩිකරන්නට නොයෙදුණොත්, විකිණීම කරන දිනට කලින් තුන් දවසකට අඩුවෙන්ද දහහතර දවසට වැඩියෙන්ද කල් ඇතිව නොකළ යුතුය. තවද විකුණන්නට තිබෙන දේපළවල විස්තරයක් ඒ දැන්වීමෙහි ඇතුළත්කොට විකිණීම කරන්නේ කවර නඩුව සම්බන්ධයෙන්ද, කවර ස්ථානයේදීද, කවර දිනක කවර වේලාවකදීද යනුත් සඳහන්කළ යුතුය.

(ii.) නිශ්චල දේපළ ලියා තහනමට ගන්නා සෑම අවස්ථාවේදීම මෙහි ඉහළින් චංචල දේපළ සම්බන්ධයෙන් නියමිතවූ අනුමටම විකිණීම ගැන දැනුම්දිය යුතුය. තවද පිස්කල්තුමා විසින් විකිණීම පිළිබඳ නොතීසියේ පිටපත් සතරක් ඉංග්‍රීසි භාෂාවෙන් හා ඇස්කිසිය නිකුත්කළ උසාවියේ භාෂාවෙනුත් සාදවා ඉන් එක පිටපතක් එතුමාගේ කාර්යාලයේද, දෙවෙනි පිටපත ඇස්කිසිය නිකුත්කළ උසාවි ශාලාවේද, තුන්වැනි පිටපත ඉඩම පිහිටි ගමේ කොටත් පෙනෙන යම්කිසි තැනකද, සිව්වැනි පිටපත විකුණන්නට තිබෙන ඉඩමේ කොටත් පෙනෙන තැනකද ගැසිය යුතුය. එබඳු සෑම නොතීසියම විකිණීම කරන දිනට අඩුගණනේ දස දිනකට කලින් ගැසිය යුතුය.

(iii.) තහනමට ගෙන විසිඑක් දවසක් ගතවනතුරු කිසිම දේපළක් නොවිකිණිය යුතුය.

56. සෑම විකිණීමක්ම පිස්කල්තුමාගේ නිලධාරියකු විසින් හෝ එතුමාගේ අත්සන දරන ලියවිල්ලකින් නියමිත පරිදි බලය දෙනලද අන්කිසිවකු විසින් හෝ පැවැත්විය යුතුය.

57. සියලුම චංචල දේපළත් නිශ්චල දේපළත් විකිණිය යුත්තේ අත්පිට ගෙවන මුදල්වලට පමණකි.

58. නිශ්චල දේපළ විකිණීමේදී ඉතා වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා බව ප්‍රකාශකරනු ලැබූ වහාම මිළ ගණන නොගෙව්වොත් ඊලඟ වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයායයි ප්‍රකාශකළ හැකිය. ඉහත සඳහන් ප්‍රකාර මුදල් ගෙවන්නට නොයෙදෙන අය ඔහු ඉල්ලුම්කළ වැඩි මිළ ගණනත් විකිණීමේදී නියමවුනු මිළ ගණනත් අතර ඇති වෙනස ගෙවීමට යටත්කළ හැකිවේ. ඒ මුදල් ගෙවන ලෙස පිස්කල්තුමා විසින් ලියවිල්ලකින් එබඳු අයට නියමකරනු ලැබූ දින සිට එක් සතියක් ඇතුළත ඒ මුදල් නොගෙව්වොත් එක් එක් අවස්ථාවේදී එසේ නොගෙවූ මුදල් ගණන මෙපමණයයි පිස්කල්තුමා සහතිකකොට ඒ ඇස්කිසිය නිකුත්කළ උසාවියේ සභාපතිතුමා වෙත යැවිය යුතුය.

59. පිස්කල්තුමා විසින් හෝ එතුමාගේ අණප්‍රකාර හෝ පවත්වනලද සෑම නිශ්චල දේපළ විකිණීම ගැනම එසේ විකිණීමෙන් පසු එක් සතියක් ඇතුළත එතුමා විසින් රපෝර්තු කළයුතුය. තවද යම්කිසි අක්‍රම ක්‍රියාවක් නිසා හෝ අනියම් ක්‍රියාවක් නිසා හෝ ඒ විකිණීම හරිනැතැයි දෙස් කියන්නාවූ ණයකාරයා විසින් හෝ අන් කිසිවෙකු විසින් හෝ එබඳු යම්කිසි කාරණයක් පිස්කල්තුමාට පෙන්නුම්කළොත් එතුමා විසින් හෝ විකිණීම සිඩවී තිස් දවසක් ඇතුළත ඒ විකිණීම ස්ථිරකිරීම ගැන විරුද්ධත්වය උසාවියට කියාසිටීමට හෝ රපෝර්තුකිරීමට හෝ ඉඩ ඇත්තේය. එවිට සභාපතිතුමා විසින් ඒ ගැන සංක්ෂෙපයෙන් විභාගයක් පවත්වා ඉන්පසු එතුමාට සාධාරණය, යුක්ති යුක්තය කියා කල්පනාවෙන අනුමට එතුමා විසින් ඒ විකිණීම ස්ථිරකිරීම අවලංගුකළ යුතුය එහෙත් විකිණීම ප්‍රසිද්ධකිරීම හෝ පැවැත්වීම සම්බන්ධයෙන් බරපතල වරදක් සිදුවුණු බවත්, ඒ නිසා ඉල්ලුම්කරුට බරපතල හානියක් සිදුවූ බවත් පෙන්නා දුන්නොත් මිස නැත්නම්, විකිණීමක් අවලංගු නොකළ යුතුය.

මේ නියෝගය ප්‍රකාර ඉඩම් විකිණීම ස්ථිරකිරීමෙහි අණවෙහි මීට යාකොට තිබෙන 9 වැනි පෝර්මයේ අඩංග සම්පූර්ණව තිබිය යුතුය.

60. විකිණීමක් ස්ථිරකිරීමට විරුද්ධව ගෙනෙනුලබන පැමිණිල්ලත් විකිණීම කළ දින සිට තිස් දවසක් ඇතුළත කියා නොසිටියොත්, අක්‍රම ක්‍රියාවක් නිසා හෝ අනියම් ක්‍රියාවක් නිසා හෝ අවලංගු නොකළ යුතුය.

61. සභාපතිතුමා විසින් විකිණීම අවලංගු නොකළොත්ද, ගැනුම්කාරයා විකුණුම් මුදල ගෙවා, ඔහුට විකුණනලද ඉඩමේ සින්නක්කර ඔප්පුවට නීති ප්‍රකාර නියමිත හරි මුද්දර ගාස්තුව පිස්කල්තුමාට සපයාදී තිබේනම්ද, (විකුණුම් මුදල ඔහු විසින් ගෙවනවිට මේ මුද්දරත් සැපයීමට ඔහු බැඳී ඇත්තේය) පිස්කල්තුමා විසින් මීට යාකොට තිබෙන උප ලේඛනයේ 10 වැනි ෆෝරමයේ පෙනෙන පරිදි, ඉඩම විකුණුම් ඔප්පුවක් පිටපත් දෙකකින් ලියාකොට සාදා අත්සන්කොට දිය යුතුය. ඒ ඔප්පුව නොතාරිස් මහතකු ඉදිරිපිට සාදා අත්සන් නොකරනු ලැබූ ඔප්පුවක් වූ නමුත් බල වලංගුවූ බැඳුම් සහිත ඔප්පුවක් වන්නේය. පිස්කල්තුමා විසින් ඒ ඔප්පුවේ මුල් පිටපත ගැනුම්කාරයාටදී දෙවෙනි පිටපත ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් මහතා වෙත, නොතාරිස් වරුන් ඉදිරිපිට සාදා අත්සන්කරන ඔප්පු දූත් යැවීමට නියමව තිබෙන අන්දමටත්, මතු කාලයේදී නියමවන අන්දමටත් යැවිය යුත්තේය.

62. ඉඩමේ සිතියමක් සෑදීමට යන සම්පූර්ණ වියදම ගැණුම්කාරයා විසින් කලින් ගෙවනු ලැබුවොත්, ඒ සිතියමද පිළියෙල කරවා පිස්කල් විකුණුම් ඔප්පුවට ඇමිණිය යුතුය.

63. ඉඩම විකිණීම පිළිබඳ ඇස්කිසියට මුල්වූ තීරණය ලැබූ අයටද උසාවියේ අවසරය කලින් ලබාගෙන සභාපතිතුමා විසින් නියමකරනු ලබන මිල ගණනකට විකිණීමේදී ඉල්ලුම්කිරීමට හෝ සින්නක්කර ගැනීමට හැකිවේ.

64. තම වාසියට ඇස්කිසිය පිටකරනු ලැබූ අය විකුණනු ලබන දේපලවලින් යම්කිසි ඉඩමක ගැනුම්කාරයා වුණොත්, ඔහුට අයවිය යුතු මුදල විකුණුම් මිල ගණනින් අඩුකරගැනීමට ඉඩදිය යුතුය. තවද විකුණුම් මිල ගණන ඔහුට අයවිය යුතු මුදල් ගණනට වැඩිවුණිනම්, සභාපතිතුමා විසින් අන්කිසි අන්දමක් නියම නොකළොත්, ඒ ඉතිරි මුදල පමණක් ඔහු විසින් ගෙවිය යුතුය.

පිස්කල්තුමාට ගෙවනු ලැබුවාවූද එතුමා විසින් අයකරගනු ලැබුවාවූද මුදල්.

65. විකිණීමක් පවත්වන නිලධාරියාට ගෙවන සියලුම මුදල්වලට රිසිට් පතක් දියයුතුයි. ඒ නිලධාරියා විසින් පිස්කල්තුමා නියමකරන කාලසීමාවක් ඇතුළත ආණ්ඩුවේ ඒජන්තතුමාගේ හෝ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගේ කාර්යාලයට ඒ මුදල් ගෙවිය යුතුය.

ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් හෝ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පැ. හතළිස්අටක් ඇතුළත පිස්කල්තුමාට රිසිට් පතක් යැවිය යුතුය. එය ලැබුණු මීට පිස්කල්තුමා විසින් විකිණීමට මුල්වූ ඇස්කිසි ලියවිල්ල එතුමාගේ රිපෝර්තුවත් සමග සභාපතිතුමාට යැවිය යුතුය.

66. ආණ්ඩුවේ ඒජන්තතුමාගේ හෝ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගේ කාර්යාලයට ගෙවන්නට යෙදෙන සියලුම මුදල්වලට ඇස්කිසි ලියවිල්ල නිකුත්කළ සභාපතිතුමාගේ අණවක්පිට සුදුස්සක් කරනතුරු ඒ කාර්යාලයේ තබාගත යුතුය.

(f) අල්ලා තහනමට ගත් දේපළට අයිතිකම් කීම.

67. උසාවියේ තීරණයක් හෝ අණවක් ඉෂ්ටකිරීම් වශයෙන් යම්කිසි චංචල හෝ නිශ්චල දේපළක් අල්ලා තහනමට ගැනීමට හෝ විකිණීමට විරුද්ධව යම්කිසි අයිතිකමක් හෝ විරුද්ධවාදිකමක් ඉදිරිපත්කරන්ට යෙදුණුවිටක එය ඉදිරිපත්කළ වහාම පිස්කල්තුමා විසින් ඒ අයිතිකම්කීම හෝ විරුද්ධවාදීකම ඇස්කිසි ලියවිල්ල නිකුත්කළ උසාවියට දැනුම්දිය යුතුය. එවිට උසාවිය විසින් ඒ අයිතිකම්කීම හෝ විරුද්ධවාදීකම ගැන සංක්ෂෙප වශයෙන් විභාගකිරීමට ඒ අයිතිකම කියන අය හෝ විරුද්ධවාදියා නඩුවේ පාර්ශ්වකාරයෙකු මෙන් සලකා පවත්ගත යුතුය.

68. අයිතිකම් හෝ විරුද්ධකම් කීම හැකිතරම් ඉක්මනින් කළ යුතුය. ඒ අයිතිකම්කීම හෝ විරුද්ධකම් කීම පිළිබඳ දේපළ විකිණීමට දින නියමකොට තිබේ නම්, ඇස්කිසි ලියවිල්ල නිකුත්කළ උසාවියේ අණපරිදි විකිණීම (පිස්කල්තුමාට ඕනෑයයි පෙනේ නම්) කල්දැමිය හැකිවේ.

69. ඒ නිශ්චල හෝ චංචල දේපළ තමාට විරුද්ධව ඇස්කිසිය පිටකරණු ලැබූ අයගේ බුත්තියේ හෝ ඔහු වෙනුවට භාරකාරයා වශයෙන් වෙන අයෙකුගේ බුත්තියේ හෝ නොතිබුණු බවවත් දේපළ තහනමට ගන්නා අවස්ථාවේදී ඔහුට බදු මුදල් ගෙවන්නාවූ හෝ වැඩකරන්නාවූ ගොවියන්ගේ හෝ අන්‍යයන්ගේ අත්අඩංගුවේ නොතිබුණු බවවත්, ඒ කාලයේදී තීන්දුවේ ණයකාරයාව ඒ දේපළ බුත්ති විඳිමින් සිටියදී, ඒ දේපළ ඔහුගේ බුත්තියේ තිබුණේ ඔහු ගණනේම හෝ ඔහුගේම දේපළ වශයෙන් නොව, වෙන අයකු ගණනේ හෝ වෙන අයකු වෙනුවෙන් භාරකාරයා වශයෙන් බවවත් සභාපතිතුමාට ඒත්තුයන අන්දමින් පෙනීගියොත් ඒ දේපළ සම්පූර්ණයෙන්ම හෝ තමාට සුදුසුයයි කල්පනාවෙන ප්‍රමාණයකට අල්ලා තහනමට ගැනීමෙන් නිදහස් කරණ ලෙස සභාපතිතුමා විසින් නියමකළ හැකි වන්නේය. එහෙත් ඒ දේපළ තමාට විරුද්ධව ඇස්කිසිය පිටකරණු ලැබූ අයගේ බුත්තියේ ඔහුගේම දේපළ වශයෙන් මිස වෙන අයකු ගණනේ හෝ ඔහු වෙනුවෙන් භාරකාරයා වෙන්නාවූ අයකුගේ බුත්තියේ තිබුණු බවවත් ඒ දේපළ අල්ලා තහනමට ගන්නා අවස්ථාවේදී ඔහුට බදු මුදල් ගෙවන්නාවූ හෝ වැඩකර දෙන්නාවූ ගොවියන්ගේ හෝ අන්‍යයන්ගේ අත්අඩංගුවේ තිබුණු බවවත් සභාපතිතුමාට ඒත්තුයන අන්දමින් පෙනීගියොත් එතුමා විසින් එකී අයිතිකම් කීම පිළිනොගෙන විකිණීමේ කටයුතු කරගෙන යන ලෙස නියමකළ යුතුය.

70. මීට පෙරටුවූ නියෝගය යටතේ කරණලද අණවක් යම් පාර්ශ්වකාරයකුට විරුද්ධවූවිට ඒ පාර්ශ්වකාරයා විසින් ඒ අණව කළ දින සිට දවස් දාහතරක් ඇතුළත තමා විසින් අරවුල් දේපළට කියනලද අයිතිකම ස්ථිරකරවා ගැනීමට, එක්කෝ තමාගේ වාසියට දී තිබෙන තීරණය ඉෂ්ටකිරීම සඳහා එකී දේපළ විකිණීමට යටත්යයි ප්‍රකාශකරවා ගැනීමට ඒ සඳහා බලය ඇති උසාවියක නඩුවක් පැවරිය හැකිවේ. එසේ නඩුවක් පැවරුවොත්, ඒ නඩුවේ ප්‍රතිඵලයට යටත්ව යටකී අණව අවසාන තීරණය වන්නේය.

බුත්තිය බාරදීම.

71. නඩු තීන්දුව දී තිබෙන්නේ ගෙවීමට යටත්කරණු ලැබූ අයගේ හෝ ඔහු වෙනුවෙන් සිටින කිසිවකුගේ අත්අඩංගුවේ තිබෙන ඉඩමකට නම්, ඒ ඉඩමේ බුත්තිය, නඩු තීන්දුවෙන් හිමිකරණු ලැබූ අයට හෝ ඔහු විසින් ඔහු වෙනුවට බුත්තිය බාරගැනීම සඳහා ඉදිරියට එවනු ලබන අයකුට ඉඩමේ බුත්තිය භාරදිය යුතුය.

72. නඩු තීන්දුව දී තිබෙන්නේ, ගොවියන් හෝ බදුකුලියට ඉන්නන් හෝ පදිංචිව ඉඳීමට හිමිකම් ඇති අන්‍යයන් හෝ පදිංචිව ඉන්නා ඉඩමකට නම්, ඒ ඉඩමේ කාටත් පෙනෙන තැනක ඇස්කිසි ලියවිල්ලේ පිටපතක් යම්කිසි පහසු තැනක ගසා අණබෙර ගැසීමෙන් හෝ සිරිත් ප්‍රකාර අන්කිසි විදියකින් හෝ ඉඩම පිළිබඳවූ නඩු තීන්දුවේ සාරාංශය ඉඩමේ පදිංචිව ඉන්නන්ට ප්‍රකාශකොට ඉන්පසු ඉඩමේ බුත්තිය බාරදිය යුතුය.

73. විකුණනලද දේපළ තීන්දුවේ ණයකාරයාගේ හෝ ඔහු වෙනුවෙන් සිටින යම්කිසිවකුගේ බුත්තියේ තිබියදී, ඒ ගැන සින්නක්කර ඔප්පුවක් 61වෙනි නියෝගය යටතේ ගැනුම්කාරයාට දී තිබෙනවිට ගැනුම්කාරයා විසින් හෝ ඔහු වෙනුවෙන් බුත්තිය බාරගැනීමට ඔහු විසින් පත්කොට තිබිය හැකි අයකු විසින් හෝ ඉල්ලීමක් කළ විට, සභාපතිතුමා විසින් ඒ ගැණුම්කාරයාට හෝ අනික් අයට බුත්තිය බාරදීමට සැලැස්විය යුතුය.

මේ නියෝගයේ විධිවිධාන යටතේ බුත්තිය බාරදීම සඳහා නිකුත්කරණ අණව මීට යාකොට තිබෙන 11 වැනි ෆෝරමයේ අන්දම සම්පූර්ණව පිළියෙලකොට නිකුත්කළ යුතුය.

74. ඇස්කිසියක කටයුතු කරගෙන යනවිට, සෑහෙන හේතු යුක්ති ඇත්නම් සභාපතිතුමා විසින් ඕනෑම අවස්ථාවකදී විකිණීම නතරකිරීමට අණවක් කළ හැකිවේ.

ඇස්කිසියේ කටයුතු නතරකිරීමට උසාවියට කරණ ඉල්ලීම කටවචනයෙන් හෝ ලියවිල්ලකින් හෝ කළහැකිවේ. සභාපතිතුමා විසින් ඒ ඉල්ලීම ගැන දැන්වීමක් ඇස්කිසිය හා සම්බන්ධකම් ඇති සියලුම පාර්ශ්වකාරයන්ට යැවීමට සැලැස්විය යුතුය. ඒ අවස්ථාව වනතුරු අයවිය යුතු පිස්කල් ගාස්තු ගෙවා නිමවනතුරු එබඳු අණවක් නොකළ යුතුය.

### නඩු පොත් විනාශ කිරීම.

75. ඉඩම් නඩු පොත් කිසිසේත් විනාශ නොකළ යුතුය. ඒවා සැලකිල්ලෙන් සුරක්ෂිතව තබාගත යුතුය.

76. මුදල් නඩු පොත්, තීරණය ප්‍රකාර මුදල් ගෙවා නැත්නම් මිස, ගෙවා තිබේනම්, නඩුතීන්දුවේ දිනසිට තුන් වසියක් ඇතුළත විනාශකළ හැකිවේ.

77. යම්කිසි නඩු පොත් රැසක් විනාශකිරීමට ප්‍රථමයෙන් ඒ නඩු පොත් රැස විනාශකිරීම සඳහා නියමකරණලද දිනට යටත් පිරිසෙයින් එක් මාසයකටවත් කලින් එසේ කරණ බවට දැන්වීම් පත්‍රයක් උසාවියේ ගසා පෙන්නුම්කර තැබිය යුතුය. එසේ කළ යුත්තේ ඉන් යම්කිසි නඩුවක සාක්ෂියක් වශයෙන් අමුණා තිබෙන ලියවිල්ලක් ඕනෑ කෙනෙකුන් විසින් ඉල්ලුම්කළ හැකිවීම සඳහාය.

### වචනාර්ථ නිරූපනය.

78. මේ නියෝගවල—

"උසාවිය" යන්නෙන් අදහස් කරන්නේ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවන ලදැයි සලකනු ලැබූ ඕනෑම ගම්බද උසාවියකි,

"දිස්ත්‍රික් නඩුකාරතුමා" යන්නට අතිරේක දිස්ත්‍රික් නඩුකාරතුමෙක්ද ඇතුළත් වේ.

"පිස්කල්තුමා" යන්නට පිස්කල්තුමා පත්කරනුලැබ සිටින පළාතේ නියෝජ්‍ය පිස්කල්තුමෙක්ද ඇතුළත් වේ.

"ආඥාපනත" යන්නෙන් අදහස්කරණුලබන්නේ 1945යේ අංක 12 දරණ ගම්බද උසාවි ආඥාපනතයි.

"සභාපතිතුමා" යන්නෙන් අදහස් කරන්නේ ගම්බද උසාවියක සභාපතිතුමායි.

79. 1927යේ පෙබරවාරි මස 18 වැනි දින හා අංක 7,568දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධකරණලද ගම්බද උසාවි සඳහා සිවිල් නඩුවිධාන සංග්‍රහයෙහි පණවනු ලැබ, පසුව පනවනලද නියෝගවලින් සංශෝධිතවූ ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

### උප ලේඛනය.

### 1 වැනි පෝරමය.

### විත්තිකාරයකුට සිතාසිය.

(4 වැනි සිවිල් නියෝගය.)

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ———— ට විරුඩවයි.

නඩුවේ නොම්මරය: ————.

ඉහතින් නම් සඳහන්වූ විත්තිකාරයා (විත්තිකාරයන්) වෙතටයි.

———— ලෙස ඉල්ලා ඉහතින් නම සඳහන්වූ පැමිණිලිකාරයා විසින් යුෂ්මතාට විරුඩව නඩුවක් පවරා තිබෙන බැවින් ඔහුට උත්තරදීම පිණිස යුෂ්මතා 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින පෙරවරු 9.30ට මේ උසාවියෙහි පෙනීසිටින ලෙස මෙයින් අණකරනු ලැබේ. යුෂ්මතා එසේ පෙනීනොසිටියොත් යුෂ්මතා ඉදිරිපිට නොසිටියදී නඩුව විභාගකොට තීරණය කරනු ලබන වග දැනගත යුතු බවට මෙයින් නියම කරමි. යුෂ්මතා පැමිණෙනවිට යුෂ්මතාගේ නඩුව ඔප්පුකිරීමට උපකාරවේයයි යුෂ්මතා විශ්වාස කරණ ලියවිලි ඇත්නොත් ඒවාත් රැගෙන පැමිණිය යුතුයි.

————

ගම්බද උසාවියේ සභාපති හෝ ලිපිකාරනැන.

19—— වැනි වර්ෂයේ ———— මස——වැනි දින දීය.

1. සැලකිය යුත්තක්.—යුෂ්මතාගේ සාක්ෂිකාරයෝ සිය කැමැත්තෙන්ම නොපැමිණෙතැයි යුෂ්මතාට සැක නම්, නඩු විභාගයට ප්‍රථමයෙන් සෑහෙන පමණ කල් ඇතුව මේ උසාවියෙන් ඉල්ලුම්කිරීමෙන්, ඕනෑම සාක්ෂිකාරයෙකුගේ පැමිණීමට හෝ ඕනෑම සාක්ෂිකාරයකු ලවා ඉදිරිපත්කරවන්නට යුෂ්මතාට හිමිකමක් ඇති ඕනෑම ලියවිල්ලක් ඉදිරිපත්කිරීමට බලකිරීම සඳහා හෝ මේ උසාවියෙන් සිතාසියක් යුෂ්මතාට ලබාගත හැක.

2. සැලකිය යුත්තක්.—පැමිණිලිකාරයාගේ ඉල්ලීම යුෂ්මතා ඒත්තුගන්නෙහි නම් නඩුවේ ගාස්තුත් සමග මුදල උසාවියට ගෙවා යුෂ්මතාගේ දේපළවලට විරුඩව කළ හැකි නඩු තීරණය ඒ උසාවියේදීම ඉෂ්ටකරනු ලැබීම වළක්වාගත යුතුයි.

### 2 වෙනි පෝරමය.

(5 වැනි සිවිල් නියෝගය).

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ———— ට විරුඩවයි.

නඩුවේ නොම්මරය: ————.

(සාක්ෂිකාරයාගේ නම, විස්තරය හා ඔහුට ලියුම් ලැබෙන පිළිවෙල) වෙතටයි.

පැමිණිලිකාරයා (හෝ විත්තිකාරයා) වෙනුවෙන් ඉහත සඳහන් නඩුවේ සාක්ෂි කීමට සහ/හෝ (ඉදිරිපත්කරන්නට ඕනෑවූ යම්කිසි ලියවිල්ලක් වේ නම්, එය පහසුවෙන් හා නියම වශයෙන් හැඳින්වෙන විස්තරයක් මෙතැන කරනු; සිතාසිය යවන්නේ සාක්ෂි කීමට පමණක් නම් එසේනැතහොත් ලියවිල්ලක් ඉදිරිපත්කිරීමට පමණක් නම් එය පැහැදිලිකර ලියයුතුය). ඉදිරිපත්කිරීමට 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින —— වරු මේ උසාවියේ පෙනීසිටින ලෙස යුෂ්මතාට මෙයින් අණකරනු ලැබේ. තවද යුෂ්මතාගේ සාක්ෂිය විභාගකරනතුරු (එසේනැතහොත් යුෂ්මතා ලියවිල්ල ඉදිරිපත්කොට නිමවනතුරු) එසේනැතහොත් ගම්බද උසාවිය නැගිට යනතුරු යුෂ්මතා ගම්බද උසාවියේ අවසරය ලබානොගෙන උසාවියෙන් පිට නොයා යුතුය.

————

ගම්බද උසාවියේ සභාපති හෝ ලිපිකාරනැන.

19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

### 3 වැනි පෝරමය.

### නඩු ලේඛන පොත.

| නඩුවේ නොම්මරය | නඩුව දැමූ දිනය | පාර්ශවකාර යන්ගේ නම් | පැමිණිල්ලේ ස්වභාවය | ඉල්ලා සිටින මුදල රු. ශ. | නඩුව අවසන්කළ දිනය | පහළ උසාවියේ තීන්දුව | ඇපෑලේදී ලැබුණු තීන්දුව හා එය දුන්වූ දිනය | නඩු තීන්දුව ප්‍රකාර ගෙවියයුතු මුදල ගෙවා නිමවූ දිනය | වැඩිපුර කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

## 4 වැනි ෆෝර්මය.

19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දිනෙන් අවසන්වූ කාලය තුළ ———— ගම්බද උසාවියේ සභාපතිතුමා විසින් කරනලද වැඩ පිළිබඳ වාර්තා ලේඛනයයි.

| | —— වැනි දිනට නොනිමවූ නඩු ගණන | —— මාසය ඇතුළත්කළ නඩු ගණන | මුළු ගණන | සිවිල් නඩු | | | | | විභාග කිරීමට තිබෙන නඩු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නිත්දුකරනලද නඩු | | | | | |
| | | | | ඒත්තු ගැනිම හෝ පැහැර හැරීම නිසා | දෙපාර්ශ්වයේ කැමැත්තෙන් | දෙපක්ෂයේ සාක්ෂි විභාග කිරීමෙන් පසු | වෙන විධිවලින් | මුළු ගණන | |
| මේ වර්ෂයේ මීට කලින් වාර්තා කරනලද නඩු | | | | | | | | | |
| සිවිල් .. | | | | | | | | | |
| වැඩිපුර කරුණු .. | | | | | | | | | |

## 5 වැනි ෆෝර්මය.

### දේපළ අල්ලා තහනමට ගැනීමට නිකුත්කරන ඇස්කිසි ලියවිල්ලයි.
### (50 වැනි සිවිල් නියෝගය.)

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි ———— විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ————ට විරුඛවයි.

නඩුවේ නොම්මරය :————.

| | රු. | ශ. |
|---|---|---|
| නඩු තීන්දුවේ | ———— | |
| ගාස්තු .. | ———— | |
| | ———— | |
| රු. .. | ———— | |
| | ———— | |

————පළාතේ පිස්කල්තුමා වෙතටයි.

ඉහලින් නම සඳහන්වූ ———— විසින් මේ උසාවියේ අඥාව ප්‍රකාර ඉහලින් නම සඳහන්වූ———— ගෙන් රුපියල් ———— ක් අයකර ගැනීමේ අයිතිය ලබා තිබෙන බැවින් එකී ———— ගේ ගෙවල්, ඉඩම්, බඩු, ණය මුදල් හා ඔහුට අයිතියයුත, මුදල් අල්ලා තහනම්කොට අවශ්‍ය වුණොත්, විකුණා මුදල්කොට අයකරගෙන ඔබ විසින් එකී දේපළ විකුණනලද්දේ කවර මුදල් ගණනකට කවරකුටද එක්කෝ කවර මුදල් ගණන්වලට කවර අයවලුන්ටද යනු ———— දින හෝ ඊට කලින් මේ උසාවියට දන්විය යුතුයි. ඒ සඳහා මේ බලපත්‍රය එහිදී ඔබ වෙත තබාගත යුතුයි.

19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

————
සභාපති.

## 6 වැනි ෆෝර්මය.

### නිශ්චල දේපල සම්බන්ධයෙන් නිකුත්කරන තහනම් කිරීමේ දන්වීමයි.

(විත්තිකාරයා) ———— වෙතටයි.

යුෂ්මතාට විරුඛව ————ගේ වාසියට, ඔහුට රුපියල් ———— ක් ගෙවන ලෙස (නඩුවේ ස්වභාවය අඩිකය ආදිය ලියනු.) 19———— මස ——වැනි දින දෙනලද තීරණයේ මුදල් ගෙවාදැමීම යුෂ්මතා විසින් කරනුනොලැබූ බැවින් ඒ සම්බන්ධයෙන් ඇස්කිසි ලියවිල්ලක් නිකුත්කළ මේ උසාවියෙන් අඥාවක් ලැබෙනතුරු මීට යාකරනලද උප ලේඛනයේ සඳහන්කරනලද දේපළ සින්නක්කරදීම හෝ අන්සතුකිරීම හෝ බැඳුමකට යටත්කිරීම එකී විත්තිකාරයාවූ යුෂ්මතාට මෙයින් තහනම්කරන බවද ඒ දේපළ හෝ ඉන් කිසි කොටසක් සින්නක්කර වශයෙන් හෝ තෑගි වශයෙන් හෝ අන්කිසි අන්දමකින් ගැනීම සියලුදෙනාටම තහනම්කරනලද බවද යුෂ්මතාට මෙයින් දනුම්දෙමි.

(අත්සන) :————.
පිස්කල්.

19 —— වැනි වර්ෂයේ ————මස —— වැනි දින දීය.

උප ලේඛනය.

## 7 වැනි ෆෝර්මය.

### ගම්බද උසාවිවලට පනවනලද සිවිල් නඩු විධාන නියෝග සංග්‍රහයේ 49 වැනි නියෝගය යටතේ නිකුත්කරනලද තහනම්කිරීමේ දන්වීමයි.

[1] ————ට

හා

[2] ————ටයි.

විරුඛව රුපියල් ———— ක් ගෙවන ලෙස ———— ට ———— ගම්බද උසාවියේ අඩිකා ———— දරන නඩුවේ ———— දින දී දෙන්නට යෙදුණු තීන්දුවේ නියමයන් ඔහු විසින් ඉෂ්ටකරන්නට නොයෙදුණු නිසා එකී විත්තිකාරයාවූ යුෂ්මතාට එකී නඩුවේ ඇස්කිසිය නිකුත්කළ උසාවියෙන් තව අඥාවක් ලැබෙනතුරු එකී ———— ගේ බුත්තියේ තිබෙන පහත සඳහන් දේපළ ඔහුගෙන් ගැනීම මෙයින් තහනම්කොට වළක්වන බව මෙයින් යුෂ්මතාට දනුම්දෙමි. එකී දේපළ නම්:—එකී ———— විසින් කියන යම්කිසි අයිතිකමකට යටත්ව විත්තිකාරයාවූ යුෂ්මතාට අයිතිවූ [3] ———— වේ.

තවද ඉහතකී පරිදි උසාවියේ තව අඥාවක් ලැබෙනතුරු එකී දේපළ ———— නමැති යුෂ්මතා විසින් කිසිම කෙනෙකුට බාරදීම මෙයින් තහනම්කොට වළක්වමි.

19 ———— මස —— දින ———— දීය.

————
පිස්කල්තැන.

[1] විත්තිකාරයාගේ නම.
[2] බුත්ති විඳින අයගේ නම.
[3] නම ලියනු.

### 8 වැනි ෆෝර්මය.

**ගම්බද උසාවිවලට පනවනලද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 49 වැනි නියෝගය යටතේ නිකුත්කරනලද තහනම්කිරීමේ දැන්වීමයි.**

[1] විත්තිකාරයාගේ නම.
[2] විත්තිකාරයාගේ ණයකරුගේ නම.
[3] ණයකාරයාගේ නම.
[4] ණයි විස්තර ලියනු.

[1] ———— ට

හා

[2] ———— ටත්ය.

———— ඔහුට විරුඬව ———— ට රුපියල් ———— ක් ගෙවන ලෙස ———— ගම්බද උසාවියේ අංකය ———— දරන නඩුවේ ———— දින දෙන්නට යෙදුණු තීන්දුවේ නියමයන් ඔහු විසින් ඉෂ්ටකරන්නට නොයෙදුණු නිසා එකී විත්තිකාරයාවූ යුෂ්මතාට එකී නඩුවේ තීන්දුව නිකුත්කළ උසාවියෙන් තවත් අණෙවක් ලැබෙනතුරු එකී [3] ———— ගෙන් දූනට යුෂ්මතාට අයවෙන්නට ඇතැයි කියන ණය මුදලක් එනම්: [4] ———— යුෂ්මතා විසින් බාරගැනීම මෙයින් තහනම්කොට වළක්වන බවද. එකී ———— නමැති යුෂ්මතා විසින් එකී ණය මුදල හෝ ඉන් කිසි කොටසක් කිසිම කෙනෙකුට ගෙවීම, ඉහතකී පරිදි තවත් අණෙවක් උසාවියෙන් ලැබෙනතුරු මෙයින් තහනම්කොට වළක්වන බවද මෙයින් දන්වමි.

———— දින දීය.

————
පිස්කල්තැන.

සැලකිය යුතු කරුණු.—1. පහත සඳහන් ගෙවීම් තහනමින් නිදහස්ය. ඒවා නම්:—

(1) ආණ්ඩුවේ නිලධාරියකුගේ හෝ සේවකයකුගේ පඩිය.
(2) කම්කරුවන්ගේ හෝ ගෙදරක මෙහෙකරුවන්ගේ පඩි.

2. තහනම් පිළිබඳ සියලු ලියුම් කියුම් ගම්බද උසාවියේ සභාපතිතුමා වෙත යැවිය යුතුය.

### 9 වැනි ෆෝර්මය.

**ඉඩම් විකිණීම ස්ථිර කිරීමේ අණෙව.**

අංකය : ————.

———— ගම්බද උසාවියේදීය.

[1] ————

[1] ස්ථානය.
[2] පැමිණිලිකාරයාගේ නම.
[3] විත්තිකාරයාගේ නම.

පැමිණිලිකාරයාවූ [2] ———— විසින් ———— විත්තිකාරයාවූ [3] ———— ට විරුඬවයි.

ඉහත සඳහන් නඩුවේ තීරණය ඉෂ්ටකිරීම් වශයෙන් පිස්කල්තුමා විසින් පහත සඳහන්වන දේපළ 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින විකුණනලදුව, ඒ විකිණීම පිළිබඳව ඒ පිස්කල්තුමාගේ රෙපෝර්තුව ලැබී තිස්දවසක් ඉකුත්වගිය නමුත් එය නිෂ්ප්‍රභා කරන්නට ඉල්ලීමක් කරලා නැති බැවින් (එක්කෝ ඒ විකිණීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනලද විරුඬකම් ප්‍රතික්ෂෙප කරනලද බැවින්) ඒ විකිණීම ස්ථිරකළයුතු ලෙස අණකරමින්ම මෙයින් ඒ විකිණීම ස්ථිරකරමි. (විකිණීම අවලංගු කරන අවස්ථාවක ඊට ගැළපෙන අන්දමින් වෙනස්කර ලිය යුතුයි.)

අත්සන : ————.
(විනිශ්චයකාරතුමාගේ නම සහ නිලය.)

19—— වැනි වර්ෂයේ ———— මස ———— වැනි දින දීය.

### 10 වැනි ෆෝර්මය

**ගම්බද උසාවියක් විසින් විකිණීම ස්ථිර කිරීමෙන් පසු සාදවාදෙන පිස්කල් විකුණුම් ඔප්පුවයි.**

**(61 වැනි සිවිල් නියෝගය.)**

පළාතේ පිස්කල්තුමා විසින් (ඇස්කිසියේ නියමයන් මෙහි සවිස්තරව ලියනු ————). ඒ පිස්කල්තුමාට (හෝ ඩෙපියුටි පිස්කල්තුමාට යනුවෙන් ඒ ඒ තැනට ගැළපෙන අන්දමින් ලියනු.) ———— ගම්බද උසාවියෙන් නිකුත් කරනලද ———— වැනි වර්ෂයේ ———— මස ———— වැනි දින දරන ඇස්කිසි ලියවිල්ලක් ලැබ, පිස්කල් ධූරන්ධර (හෝ ඩිපියුටි පිස්කල් ධූරන්ධර ———— මහතාණන් විසින් මෙහි පහත විස්තර කරනලද දේපළ අල්ලා තහනමට ගන්නා ලදුව, ඒ දේපළ නියමිතපරිදි දැනුම්දීමෙන් පසුව ———— වැනි දින ———— දී ———— විසින් මහජනයා ඉදිරිපිට ප්‍රසිඬ වෙන්දේසියේ විකුණනලදින් ඒ වෙන්දේසියේදී ඉතා වැඩි ඉල්ලුම්කාරයාවූ ———— ට රුපියල් ———— ට විකුණනු ලැබූ නිසාද:

එකී ————(ගැණුම්කාරයා) එකී පිස්කල්තුමාට එකී විකුණුම් මුදල සම්පූර්ණයෙන් ගෙවනලදින් එකී දේපළ පිළිබඳව එකී ————ගේ සියලු හිමිකම්, අයිතිකම් හා සම්බන්ධකම්වලට හිමිකාරයාවූ නිසාද:

මීට පිටපතක් යාකර තිබෙන 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දරන අණෙවකින් එකී උසාවිය විසින් එකී විකිණීම ස්ථිර කරනු ලැබූ නිසාද:

එකී ———— නමැති පළාතේ පිස්කල්තුමා විසින් ඉහත සඳහන් ප්‍රකාර එකී ගැණුම්කාරයා විසින් ගෙවනලද්දාවූද (එක්කෝ ඔහුට හිලව්කර දෙනලද්දාවූද) එකී ———— මහතාණන් විසින් ලැබුණු බව ඊත්තුගන්නා ලද්දාවූද රුපියල් ———— කාරණකොට ගෙන එකී ගැණුම්කාරයාටද, ඔහුගේ උරුමක්කාර, පොල්මක්කාර, අද්මිනිස්ත්‍රාසිකාර, පවරා ලැබුම්කාරයන්ටත් මීට යාකොට තිබෙන සිතියමේ විස්තරකර දක්වන ලද්දාවූද (ගැණුම්කාරයාට බාරදෙන යම් මුල් ඔප්පුවකට යාකොට තිබිනම් ඒ බවද, මුල් ඔප්පුවක් නැත්නම් මේ ඔප්පුවට යාකොට තිබෙන බවද මෙහි ලියනු.)

(මෙතැන ඉඩමේ නම, මහත ප්‍රමාණය සහ මායිම් ඇතුළත් විස්තරයක් දෙනු.) අංකය ———— දරන්නාවූද ඉඩමේ සියලුම අයිතිය ඊට අයිති සියලු දේත් සමඟ එකී ගැණුම්කාරයාටද ඔහුගේ උරුමක්කාර, පොල්මක්කාර, අද්මිනිස්ත්‍රාසිකාර පවරා ලැබුම්කාර සියල්ලන්ටම සදාකාලයටම අයිතිවන ලෙස සින්නක්කර විකුණා පවරා දෙනලද බවද මේ ඔප්පුවට සාක්ෂි දරන්නේය.

ඊට සාක්ෂියක් වශයෙන් එකී පිස්කල්තුමා 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— දී මීට අත්සන තබනලදී.

සාක්ෂිනු:

————
පිස්කල්තැන.

අමුණනලද ලියවිලි.

11 වැනි පෝරමය.

යම් දේපළක් නඩු තීන්දුවේ ණයකාරයාගේ බුත්තියේ තිබෙන විට ගැණුම්කාරයාට එහි බුත්තිය බාරදෙන ලෙස යවන අණව.

අංකය : ————.

[1] ———— [2] ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ [3] ———— විසින් විත්තිකාරයාවූ [4] ———— ට විරුඬවයි.

———— පළාතේ පිස්කල්තුමා වෙතටයි.

ඉහත සඳහන් නඩුවේ තීන්දුව ඉෂ්ටකිරීම වශයෙන් පවත්වනලද වෙන්දේසියේදී [5] ———— වල ගැනුම් කාරයාවූ බැවින්ද එකී [5] දේපළ ———— ගේ බුත්තියේ තිබෙන බැවින්ද එකී ———— [6] ———— ට එහි බුත්තිය ගෙන බාරදීමටද, ඕනෑවුණිනම් නඩු තීන්දුවෙන් බැඳිසිට ඒ දේපළවල බුත්තිය හැරදමා අස්වැන්නට බැරිය කියා සිටින ඕනෑම කෙනෙකු අස්කිරීමටද මෙයි.

[7] අත්සන : ————.

19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— දීය.

[1] ස්ථානය.
[2] උසාවිය.
[3] පැමිණිලි කාරුගේ නම.
[4] විත්තිකරුගේ නම.
[5] ඉඩමේ නම හා විස්තරය.
[6] ගැණුම්කරුගේ නම.
[7] විනිශ්චයකාර තුමාගේ නම සහ නිලය.

---

L. D.—B. 97/46.

## 1945ගේ අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනත.

අංක 9,773 හා 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරන විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනලද ප්‍රකාශයෙන් සංශොධනය කරනලද ප්‍රකාර 1945ගේ අංක 12 දරන ගම්බද උසාවි ආඥාපනතේ 52 වැනි වගන්තියෙන් අධිකරන අමාත්‍යතුමාට පැවරී තිබෙන බලය ප්‍රකාර එතුමා විසින් පනවනලද නියෝග.

වී. සිවසුප්‍රමානියම්,
අධිකරන අමාත්‍ය කාර්‍යාංශ මණ්ඩලයේ ස්ථිර ලේකම් වෙනුවට.

1948 සැප්තැම්බර් මස 28 වැනි දින
කොළඹදීය.

### ක්‍රිමිනෙල් නඩු සංවිධානය පිළිබඳව ගම්බද උසාවිවලට පණවනලද නියෝග.

I.—නඩු විභාගය ආරම්භකිරීම.

1. (1) වරදවල් පිළිබඳව ගම්බද උසාවිවලට කරන පැමිණිලි—
   (a) සභාපතිතුමා වෙත කටවචනයෙන් හෝ
   (b) පැමිණිලිකරු විසින් අත්සන්කොට දින දමා සභාපතිතුමාට භාරදෙනලද ලියවිල්ලකින්, හෝ

කළ හැකිවේ.

(2) කටවචනයෙන් පැමිණිල්ලක් කරනු ලැබූ විටෙක, එය සභාපතිතුමා විසින් ඒ වේලාවේදීම ලියාගත යුතුය.

පැමිණිලි ලියවිල්ලක් පැමිණිලිකාරයකු විසින් බාරදෙනුලැබූ එක්කෝ එවනු ලැබූ විටෙක, සභාපතිතුමා විසින් එය ලැබුණු දිනය එහි සටහන්කොට ස්වකීය අත්සන හෝ මුලකුරු අත්සන පිහිටුවීමෙන් ඒ පැමිණිලි පත්‍රය වලංගුකළ යුතුයි.

(3) වරදක් කරනලද බව ප්‍රකාශවී තිබෙන බැවින් සභාපතිතුමා විසින් නඩු විභාගයක් කිරීමට නිශ්චයකරගෙන තිබෙන විට—
   (a) පැමිණිලි ලියවිල්ල සභාපතිතුමා විසින් ලියාගනු ලැබුවත් එවනු ලැබුවත් නඩු පොතේ කොටසක් වශයෙන් අමුණා තැබිය යුතුයි.
   (b) ඒ නඩු පොතට පහත සඳහන් විස්තර සඳහන්වූ කඩදාසියක්ද ඇමිණිය යුතුයි. ඒ විස්තර නම් :—
      (i.) නඩුවේ නොම්මරය ;
      (ii.) නඩුව දැමූ දිනය ;
      (iii.) පැමිණිලිකාරයාගේත්, විත්තිකාරයාගේ හෝ විත්තිකාරයන්ගේත් නම් ;
      (iv.) වරදකළාය කියන දිනය හා ස්ථානය ;
      (v.) විත්තිකාරයාට හෝ විත්තිකාරයන්ගෙන් එක් එක්කෙනාට ඉදිරිපත්කරනු ලැබ තිබෙන වරද හෝ ඒ වරදේ විස්තරය ;
      (vi.) යම්කිසි ආඥාපනතක් හෝ ආඥාපනතක වගන්තියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථාවක් හෝ යටතේ ඒ වරදට දඬුවම් පැමිණවිය හැකිනම් ඒ ආඥාපනතේ හෝ වගන්තියේ හෝ අතුරු ව්‍යවස්ථාවේ හෝ ව්‍යවස්ථාවේ හෝ නම, අංකය හෝ සංඥා විස්තරය.

2. (1) පැමිණිලිකාරයා විසින් තමාගේ සාක්ෂිකාරයන්ගේ නම් කටවචනයෙන් හෝ ලියවිල්ලකින් හෝ දිය යුතුයි. ඒ සාක්ෂිකාරයන්ගේ නම් කටවචනයෙන් දුන්නොත් සභාපතිතුමා විසින් ඒ නම් සහ ඔවුන්ට ලියුම් ලැබෙන පිළිවෙළත් ලියාගත යුතුයි, ලියාපු නම් ලැයිස්තුවක් බාරදුන්නොත්, එය සභාපතිතුමා විසින් මුලකුරු අත්සන තබා දින දමා නඩු පොතේ අමුණා තබන්නට සැලැස්විය යුතුයි.

(2) යම්කිසි නඩු විභාගයකදී විත්තිකාරයාට එක්කෝ විත්තිකාරයන්ගෙන් එක් එක්කෙනාට විරුඬව ගෙනඑනලද චෝදනාවට වැරදිකාරයාද නිවැරදිකාරයාද කියා තම වගඋත්තරය කියන්නට නියමකරනුලබන වේලාවේදී ඔහු සම්බන්ධයෙන් යථොක්ත (1) වැනි ඡෙදයේ විධිවිධාන යෙදෙන්නේය.

3. (1) පැමිණිල්ල කරන වේලාවේදී පාර්ශ්වකාරයන් හා සාක්ෂිකාරයෝ පැමිණ සිටිත්නම්, එක්කෝ ප්‍රමාදයක් නැතිව ඔවුන් කැඳවාගත හැකි නම්, සභාපතිතුමා විසින් නඩුව විභාගකිරීම පටන්ගත යුතුයි.

(2) විත්තිකාරයා හෝ යම්කිසි වැදගත් සාක්ෂිකාරයෙක් පැමිණ නොසිටී නම්, සභාපතිතුමා විසින් නඩුව ඇහීමට දිනයක් නියමකළ යුතුය. තවද එදිනට ඒ එක් එක් විත්තිකාරයා සහ සාක්ෂිකාරයාත් පැමිණිය යුතුයයි නියම්කොට සිතාසි පිටකළ යුතුය.

4. යම් කිසිවකුට විරුඬව නගනලද එක් එක් වරද ගැන වෙන් වෙන් වශයෙන් එක් එක් නඩුව බැගින් ඇහිවිය යුතුය. එසේ වුනුමුත්—
   (a) යම් කිසිවකු විසින් දොළොස් මස් කාලයක් තුළ කරනලද එක විධියේ වරදවලින් එකකට වැඩි ගණනක් කරනලදැයි ඔහුට විරුඬව චෝදනාකරනුලැබ සිටිනවිට එබඳු වරදවල් තුනක්ම එකම නඩුවකට ඇතුළත්කොට විභාගකළ හැකිවේ.
   (b) එකම සිඬියේදී සිදුවූ ක්‍රියා කිහිපයකින් එකකට වැඩි ගණනක් එකම තැනැත්තකු විසින් කරතිබෙන විටෙක ඒ වැරදි සියල්ලම එකම නඩුවකට ඇතුළත්කොට ඔහුට විරුඬව නඩුව විභාගකළ හැකිවේ ;
   (c) එක්කෙනකුට වැඩි ගණනක් විසින් එක්ව එකම වරද කර තිබෙන විටෙක ඒ සියලුදෙනම එකම නඩුවකට ඇතුළත් කොට නඩුව විභාගකළ හැකිවේ.

5. පැමිණිලිකාරයා විසින් හෝ විත්තිකාරයා විසින් හෝ සෑහෙන පමණ කරුණු දක්වා සිටිවිටෙක සභාපතිතුමා විසින් නඩුව ඇසීමේ දිනය කල්දැමිය හැකිවේ. එසේ කළ විටෙක නඩුව කල්දැමූ දිනය කටවචනයෙන් හෝ, සිතාසි යැවීමට නියමිත අන්දමට බාරදෙනලද නොතීසියකින් හෝ පාර්ශ්වකාරයන්ට දැන්විය යුතුය. නඩුව කල්දැමූ විටෙක, ඒ කල්දැමීමට ඇතුවූ හේතු සභාපතිතුමා විසින් නඩු පොතේ ලිය යුතුය.

II.—අල්ලා සිරභාරයට ගැනීම.

6. මීට යාකර තිබෙන II වැනි උප ලේඛනයෙහි සඳහන්වූ වරදවලින් ඕනෑම වරදක් තමන් ඉදිරිපිටදී කරන ඕනෑම කෙනකු ඕනෑම පොලිස් නිලධාරියකු විසින් හෝ පොලිස් රාජකාරිකිරීමට ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පත්කරනලද ඕනෑම මුලාදෑනියකු විසින් අල්ලා සිරභාරයට ගත හැකිවේ.

III.—ගම්බද උසාවිවල සිතාසි.

7. එක් එක් ගම්බද උසාවියේ සෑම සිතාසියම, ආඥාපණතේ 20 වැනි වගන්තිය යටතේ උසාවියේ නඩු විභාගය කරන භාෂාවෙන් පිටපත් දෙකකින් යුක්තකොට ලියා නිකුත්කළ යුතුවේ.

8. (1) විත්තිකාරයකුට යවන සෑම සිතාසියම I වැනි උප ලේඛනයේ 1 වැනි පෝරමය ප්‍රකාර යැවිය යුතුයි. සාක්ෂිකාරයකුට යවන සෑම සිතාසියම ඒ උප ලේඛනයේ 2 වැනි පෝරමය ප්‍රකාර යැවිය යුතුය.

(2) ආඥාපනත යටතේ කරන යම්කිසි විභාගයක් සඳහා යම්කිසි ලියවිල්ලක් හෝ දෙයක් ඕනෑවුණොත් එක්කෝ ගෙන්විය මනායයි සභාපතිතුමාට කල්පනාවුණොත් එතුමා විසින් I වැනි උප ලේඛනයේ 2 (ii) වැනි පෝරමයේ සිතාසියක් එකී ලියවිල්ල හෝ දෙය තම වසගයේ හෝ බලමණ්ඩලයේ තබාගෙන ඉන්නා බවට විශ්වාසකර තිබෙන අය වෙත නිකුත්කොට ඒ සිතාසියේ සඳහන් කරනලද තැනදීද, දිනදීද, වේලාවේදීද පෙනීසිට ඉදිරිපත්කරන ලෙස නියෝගකළ හැකිවේ.

(3) මේ නියෝගය යටතේ ලියවිල්ලක් ඉදිරිපත්කිරීමට පමණක් අණකරනු ලැබූ ඕනෑම කෙනකු තමාම උසාවියට පැමිණ එසේ කරනවා වෙනුවට ඒ ලියවිල්ල හෝ දෙය වෙන කෙනකු විසින් ගෙන අවුත් ඉදිරිපත්කරන්නට සැලැස්සුවොත් ඒ නියෝගය ඉෂ්ටකළාසේ සලකනු ලැබේ.

(4) සෑම සිතාසියම සභාපතිතුමා විසින් හෝ එතුමා විසින් බලය දෙනුලැබූ ලිපිකරුවකු විසින් හෝ අත්සන්කළ යුතුවේ.

9. (1) සිතාසිය සාමාන්‍යයෙන් ගම් මුලාදෑනිතැන නමට යැවිය යුතුයි. ඔහු එය රැගෙන ගොස් එහි නම සඳහන්වූ අයට එහි දෙවැනි පිටපත අතින් බාරදී, එය බාරදුන් බව එහි මුල් පිටපතේ ලියා සභාපතිතුමාට රපෝර්තුකර යැවිය යුතුය.

(2) සිතාසියක් බාරදෙන්නට ඕනෑකරන තැනැත්තා සෑහෙනතරම් උනන්දුවෙන් සොයාත් හමුවිය නොහැකිවූ විටෙක ඒ සිතාසිය ඔහුට ලැබෙන ලෙස ඔහුගේ පවුලේ වැඩියකු වෙත බාරදීමෙන් හෝ ඔහු සාමාන්‍යයෙන් පදිංචි ගෙයි හෝ ගෙදර හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ බාරදීමට උසාවියෙන් අණක් ලැබුණොත් එසේ කළ හැකි වන්නේය. එසේ කරනුලැබූ සෑම අවස්ථාවේම සිතාසිය නිසිසේ බාරදෙනු ලැබූවාක් මෙන් සැලකිය යුතු වන්නේය.

10. සිතාසියක් නිසි ලෙස බාරදීමෙන් පසු යම්කිසි විත්තිකරුවකු හෝ සාක්ෂිකරුවකු උසාවියට පැමිණෙන්නට බැරිය කියා සිටියොත් හෝ එක්කෝ පැහැර හැරියොත් සෑහෙන කරුණක් නැතිව ඔහුට පැමිණෙන්නට නියමවූ දිනදී හෝ සභාපතිතුමා විසින් පැමිණෙන්ට අණකරනලද අන්කිසි දිනයකදී උසාවියට නොපැමිණ පැහැර හැරියොත්, මෙහි I වැනි උප ලේඛනයේ 3 වැනි පෝරමයෙහි පුරවනලද වරෙන්තුවක් සභාපතිතුමා විසින් තම අත්සනින් නිකුත්කොට ඒ විත්තිකරු හෝ සාක්ෂිකරු අල්ලා උසාවිය ඉදිරිපිටට ගෙනඒමට සැලැස්විය හැකිවේ.

IV.—පැමිණිලිකරු නොපැමිණිවිට ඉෂ්ටකළයුතු කටයුතු.

11. සිතාසිය ඉදිරිපත්කළ යුතු දිනදී හෝ පැමිණිල්ල විභාගකිරීමට නියමකරනලද දිනදී, පැමිණිලිකාරයා නොපැමුණුණොත්, ඔහුගේ නොපැමිණීමේ හේතු දක්නුම්දී නැත්නම්, පැමිණිල්ල අහක දැමිය හැකිවේ.

එහෙත්, ඒ පැමිණිලිකරු යුක්ති යුක්ත කාලසීමාවක් තුළ තමාගේ පැමිණීම වළකුණේ යම්කිසි අදිස්සියක් හෝ අභාග්‍යයක් හේතුකොටගෙනය පැහැරහැරීමක් නිසා නොවේයයි සභාපතිතුමාට ඒත්තුගැන්නුවොත්, ඔහුට නඩුව උඩගන්නට සභාපතිතුමා විසින් ඉඩදිය හැකිවේ. තවද පැමිණිල්ල අහක දැමීමට කරනලද නියමය අවලංගුකොට නඩුව විභාගකිරීම සඳහා කටයුතුද කළ හැකිවේ.

V.—පැමිණිවිට කළයුතු කටයුතු—නඩුව ඇසීම.

12. (1) එක් එක් දවසේදී කෙරෙන කටයුතු නඩු පොතේ සටහන්කළ යුත්තේ ඒ ඒ දවසේදී පැමිණිසිටින පාර්ශවකාරයන්ගේ නම් සටහන්කිරීමෙන් පසුවයි.

(2) ආඥාපනතේ 23 වැනි වගන්තියේ නියෝග යටතේ නඩුවක් සාමදානයකරනවිට ඒ සාමදානයේ කොන්දේසි සටහන්කොට එය පාර්ශවකාරයන්ට කියවා තේරුම්කර දුන්නාට පසු ඊට ඔවුන්ගේ අත්සන්කරවාගත යුතුයි.

13. (1) විත්තිකාරයා පෙනීසිටියවිට ඔහුට විරුඬව ඉදිරිපත්කර තිබෙන චෝදනාවේ සඳහන්වූ වරද සභාපතිතුමා විසින් ඔහුට කියා තේරුම්කරදී ඔහු වරදකාරයා නොකිරීමට තම නිදහසට දක්විය හැකි යම්කිසි කරුණක් තිබේදැයි ඇසිය යුතුයි. මේ කටයුතු මෙසේ ඉෂ්ටකළ බවද නඩු පොතේ සටහන්කළ යුතුයි.

(2) (1) වැනි ඡේදය යටතේ ප්‍රශ්නකරනු ලැබූවිට, විත්තිකාරයා විසින් තමාට විරුඬව නගනලද චෝදනාවේ සඳහන්වූ වරදට තමා වරදකාරයාය කියාසිටියොත් එක්කෝ තමා වරදකාරයායයි සම්පූර්ණයෙන් ඒත්තුගැනීමක් හා සමානවූ කට උත්තරයක් කීවොත් ඒ කට උත්තරය විත්තිකාරයා විසින් පාවිච්චිකරනලද වචනවලට හැකිතරම් කිට්ටුවන අන්දමින් ලියාගෙන එවේලේම ඔහු වරදකාරයා බවට විනිශ්චය ලියා ඔහුට දඬුවම් නියමකොට ඒ දඬුවම් නියමය නඩු පොතේ සටහන්කළ යුතුයි.

(3) විත්තිකාරයා නිවැරදිකාරයාය කියාසිටියොත් සභාපතිතුමා විසින් ඔහුගේ ඒ කට උත්තරයත් ඔහුට සාක්ෂි ඇත්නම්, ඒ සාක්ෂිකාරයන්ගේ නමුත් ලියාගෙන නඩුව ඇසීම කල්දමා උවමනා වියහැකි අන්දමින් ඒ සාක්ෂිකාරයන්ට සිතාසිද පිටකළ හැකිවේ.

14. (1) නඩුවක් අසන අවස්ථාවේදී කටයුතුකිරීමේ පිළිවෙළ පහත සඳහන් ප්‍රකාර විය යුතුය:—

(a) පැමිණිලිකාරයාගේ සාක්ෂිය දිවුරුම් හෝ සහතික පිට අසා ලියාගැනීම;
(b) පැමිණිලිකාරයාගේ සාක්ෂිකාරයන්ගේ සාක්ෂි දිවුරුම් හෝ සහතික පිට අසා ලියාගැනීම;
(c) විත්තිකාරයාගේ සාක්ෂිය දිවුරුම් හෝ සහතික පිට අසා ලියාගැනීම;
(d) විත්තිකාරයාගේ සාක්ෂිකාරයන්ගේ සාක්ෂි දිවුරුම් හෝ සහතික පිට අසා ලියාගැනීම;
(e) විනිශ්චය;
(f) නඩු තීන්දුව හා දඬුවම් නියම කිරීම.

(2) එක් එක් පාර්ශවය විසින් විරුඬ පාර්ශවයෙන් හරස් උත්තර ඇසීමද සවකීය සාක්ෂිකාරයන්ගෙන් මුල් වරට සහ නැවතත් ප්‍රශ්න ඇසීමද කළ හැකිවේ.

(3) සභාපතිතුමාට ඕනෑයයි කල්පනාවුණොත් පැමිණිලිකාරයා හෝ ඔහුගේ සාක්ෂිකාරයන්ගෙන් ඕනෑම කෙනකු හෝ තවදුරටත් ප්‍රශ්නකිරීම සඳහා නොහොත් හරස් උත්තර ඇසීම සඳහා ඔහු හෝ ඔවුන් ගෙන්වීමත්, වැදගත් සාක්ෂියක් කියහැකි කෙනකු මෙන් එතුමාට පෙනීයන යමකු සාක්ෂිකාරයකු වශයෙන් කැඳවීමත් එතුමා විසින් කළ හැකිවේ.

(4) විත්තිය ඔප්පුකරන ලෙස සභාපතිතුමා විසින් විත්තිකාරයාට නියම කරනවිට ඔහු වෙනුවෙන් සාක්ෂිය කියා සිටීමට ඔහුට ඇති හිමිකම ගැන කියාදීමද ඔහුට විරුඬව පැමිණිල්ලෙන් ඔප්පුවී තිබෙන ප්‍රධාන කරුණු ගැන තම නිදහසට හේතු පහදාදීම සඳහා ඔහුට අවකාශයක් ඇතිවියහැකි වනසේ ඒ ප්‍රධාන කරුණු මේ මේයයි පෙන්වාදීමද කළ යුතුය.

(5) විත්තිකාරයා තමාගේ සාක්ෂිය කියන්නට හෝ සාක්ෂීන් කැඳවන්නට හෝ නිශ්චය කරගත්තොත් සභාපතිතුමා විසින් ඔහුගේ සාක්ෂිකාරයන්ගෙන් තවදුරටත් සාක්ෂි ඇසීමට හෝ හරස් උත්තර ඇසීමට හෝ නැවත කැඳවිය හැකිවේ.

(6) විත්තිකාරයකුට විරුඬව සාක්ෂිවල පෙනෙන්ට තිබෙන යම් යම් කරුණු පහදාදීමට ඔහුට අවකාශයක් සැලසෙනසේ සභාපතිතුමා විසින් ඔහුට ඒ කරුණු පෙන්වාදී, නඩුව අසන අතරතුර කවර අවස්ථාවකදී වුවත් ඒ සඳහා ඇසියමින යයි එතුමාට කල්පනාවෙන ප්‍රශ්න ඇසිය හැකිවේ. එහෙත්, එබඳු කවර ප්‍රශ්නයකටවත් උත්තරදීමට හෝ කට උත්තරයක් කීමට හෝ විත්තිකාරයාට බලකිරීමක් නැති බව ඔහුට පළමුවෙන් දැන්විය යුතුය.

එහෙත්, එකී කරුණු විත්තිකාරයාට පෙන්වාදුන් විට හෝ ඒවා ගැන ප්‍රශ්න කරනු ලැබූවිට හෝ ඔහු විසින් දෙනු ලබන යම්කිසි උත්තරයක් හෝ කියනුලබන කට උත්තරයක් වේනම්, සභාපතිතුමා විසින් එය සටහන් කරගත යුතුය.

15. පාර්ශවකාරයන්ගේත් සාක්ෂිකාරයන්ගේත් එක්කෝ ඔවුන් අතුරෙන් සාක්ෂි ඇසිය යුතුයයි සභාපතිතුමාට හෝ පාර්ශව කාරයන්ටම ඕනෑ වෙන තැනැත්තන්ගේත් සාක්ෂි ඇසුවාට පසු සභාපතිතුමා විසින් විත්තිකාරයා වැරදිකාරයා බවට හෝ නිවැරදිකාරයා බවට ස්වකීය තීන්දුව ලියා උසාවියේදී ප්‍රසිද්ධ වශයෙන් කියවා දිය යුතුයි.

විත්තිකාරයා නිවැරදිකාරයා බවට එතුමාගේ තීන්දුව වේනම්, එතුමා විසින් වහාම ඔහු නිදහස්කර ඇරිය යුතුය.

16. නඩුවේ කවර අවස්ථාවකදී වුවත් විත්තිකාරයා නිදහස්කිරීමට සභාපතිතුමාට බලය තිබේ. නමුත් එසේ නිදහස් කිරීමට හේතුවූ කරුණු එතුමා විසින් නඩු පොතේ ලිය යුතුයි.

17. පහත සඳහන්වන කරුණු නඩු තීන්දුවේ ප්‍රකාශවිය යුතුයි, එනම්:—

(*a*) විත්තිකාරයා වැරදිකාරයා බවට තීන්දුකළේ නැතහොත් නිදහස්කළේ කවර වරදක් සම්බන්ධයෙන්ද යන්න; හා

(*b*) සභාපතිතුමාගේ තීන්දුව දීමට හේතු කවරේද යන්නත්ය.

18. විත්තිකාරයා වැරදිකාරයා බවට තීන්දුකරනු ලැබුවොත්, සභාපතිතුමා විසින් ඔහුට දඬුවම් නියම්කළ යුතුයි.

19. (1) එකකට වැඩිගණනක් වැරදිවලට එකම නඩුවේදී විත්තිකාරයා වැරදිකාරයා කරනු ලැබූ විටෙක ඒ වැරදිවලට දෙන දඬුවම් එක්කොට නියමකළ හැකිවේ. එහෙත්, එසේ දෙන දඬුවම, සභාපතිතුමකු විසින් සිරගෙට නියම්කරන්නට බලය ඇති වැඩිම කාලයට එක්කෝ නියම්කරන්නට බලය ඇති වැඩිම දඩයට වැඩිනොවිය යුතුයි.

(2) සභාපතිතුමා විසින් විත්තිකාරයා කලකට සිරගෙට යැවීමට නියම්කළොත් පහත සඳහන් I වැනි උප ලේඛනයේ 4 වැනි පෝරමයේ බලපත්‍රයක් ලියාදිය යුතුයි.

(3) දඩයක් නොගෙවීම නිසා සිරගෙයි තබාගැනීම ඒ දඩය ගෙවූ විටම එක්කෝ නීති මාර්ගයෙන් අයකරගත් විටම අවසන්විය යුතුය.

(4) දඩයක් නොගෙවීම නිසා සිරගෙට නියමකරනලද කාලය ගෙවෙන්ට මත්තෙන් දඩ මුදලෙන් කොටසක් ගෙවනු ලැබුවොත් එක්කෝ අයකරගනු ලැබුවොත් නොගෙවා ඉතිරිව තිබෙන මුදල් කොටස, විත්තිකාරයාට සිරගෙයි සිටින්නට නියම්වූ කාලයෙන් ඉතිරි කොටසට සමානවූ දඩ මුදල් ප්‍රමාණයට අඩු නැත්නම්, සිරගෙයි සිටීම එතැනින් අවසන්විය යුතුය

(5) දඩ මුදලෙන් යම් කොටසක් උසාවියට ගෙවනු ලැබුවොත් එය ගෙවාපු බවද ගෙවූ මුදල් ගණනද ඉතිරි මුදල් ගණන නොගෙවූ නිසා විත්තිකාරයා සිරගෙට නියමකර යවන සභාපතිතුමාගේ අත්සනින් බලපත්‍රයේ ලියා සටහන්කළ යුතුය.

## VI.—වරදවල් හා සම්බන්ධවූ දේපළ විකිණීම හෝ ඒ ගැන සුදුස්සක් කිරීම.

20. නඩුවකට ඉදිරිපත්කරණලද සතුන් ඇත්නම් එක්කෝ ඉක්මනින් හෝ සොබා දහමට අනුව කුණුවී දිරා යන දේවල් ඇත්නම් ඒ සතුන් හෝ දේවල් හිමිකාරයන් යයි සභාපතිතුමාට කල්පනාවෙන අයට ඒ සතුන්ගේ හෝ දේවල ආරක්ෂාව සැලසෙන අන්දමේ කොන්දේසි සහිතව හෝ රහිතව බාරදීමට එතුමා විසින් ඕනෑ වේලාවක නියමකළ හැකිවේ. ඒ සතුන් හෝ දේවල් හිමි අය හරියට සොයාගත නොහැකිනම් ඒ සතුන් හෝ දේවල් විකුණා ඉන් ලැබෙන මුදල උසාවියේ තැන්පත්කරන ලෙස සභාපතිතුමා විසින් නියමකළ හැකිවේ.

21. (1) නඩුවක් අවසානවූ පසු, ඒ නඩුව සම්බන්ධව ඉදිරිපත්කරන ලද්දවූද, කරන ලදැයි පෙනෙන වරදට, සම්බන්ධකම් ඇත්තාවූද යම්කිසි ලියවිල්ලක් හෝ වෙන දෙයක් හෝ සතකු දීමට හෝ ඒ ගැන සුදුස්සක් කිරීමට නියමයක් සභාපතිතුමාට සුදුසුයයි කල්පනාවෙන අන්දමින් කළ හැකි වේ.

(2) ඇපෑලක් ගන්ට පුළුවන් නඩුවක මේ නියෝගය යටතේ මෙබඳු නියමයක් කළ විටෙක (ඒ දේපළ, සතුන් එක්කෝ ඉක්මනින් හෝ සොබා දහම අනුව කුණුවී දිරා යන දේ නොවේනම්) ඇපෑල ගන්නට ඉඩ තිබෙන කාලසීමාව ගතවනතුරු හෝ ඒ කාලසීමාව තුළ ගන්නාලද අපෑලේ තීන්දුවක් ලැබෙනතුරු ඒ නියමය ක්‍රියාවේ නොයෙදිය යුතුය.

22. නඩුවකට ඉදිරිපත්කරනලද දේපළ හිමි තැත්තා කවුදැයි දන්නේ නැති විටෙක, නඩුව අවසන්වී මාස හයක් ගතවූ තැනදී, ඒ දේපළ ගැන සුදුස්සක් ආණ්ඩුව විසින් කළ හැකි වේ. 20වෙනි නියෝගය යටතේ දේපළ විකිණීමෙන් ලැබී උසාවියේ තැන්පත්කර තිබෙන මුදලුත් ඒ වාගේම ආණ්ඩුවේ අරමුදලට එකතුකළ යුතුවේ.

## VII.—නඩු කල්දැමීම හා කලකට අත්හිටවීම.

23. සාක්ෂිකාරයකු නොපැමිණී නිසා හෝ අන්කිසි යුක්ති යුක්ත හේතුවක් නිසා හෝ යම්කිසි නඩු විභාගයක් කල් දැමීම හෝ කලකට අත් හිටවීම ඕනෑවුණොත් එක්කෝ තුවණට හුරුවුණොත් සභාපතිතුමා විසින් එය යුක්ති යුක්තයයි එතුමාට කල්පනාවෙන දිනයකට කල්දැමීමට හෝ කලකට අත්හිටවීමට කලින් කල නියමකළ හැකිවේ.

24. නඩුව ඇසෙන අතරතුර ඕනෑම අවස්ථාවකදී, වරද කරපු ස්ථානය හෝ වරද කරනලද්දේ යම්කිසි දේපළක් සම්බන්ධව නම්, එය හෝ පරීක්ෂාකර බැලීමට අවකාශයක් ලැබෙනතුරු නඩුව ඇසීම කල්දැමීම හෝ අත්හිටවීම අවශ්‍යයයි සභාපතිතුමාට කල්පනාවුණොත් එතුමා විසින් එසේ කළ හැකිවේ. ඒ පරීක්ෂණය පවත්වන වේලාව හා තැන සභාපතිතුමා විසින් පාර්ශවකාරයන්ට නිසිප්‍රකාර දැන්විය යුතුය. එසේ දැනුම්දීමේදී ඒ පරීක්ෂණය පවත්වන තැන පාර්ශවකාරයන්ට පෙනීසිටීමට හිමිකම් ඇති බවද සඳහන් කළ යුතුය.

25. අසනීපයක් හෝ අන්කිසි හේතුවක් නිසා සභාපතිතුමා නොපැමිණී විටෙක උසාවියේ ඇපැල් නඩු විසඳීමේ බලය දරන දිස්ත්‍රික් නඩුකාරතුමා විසින් ඒ සඳහා නියමිත පරිදි බලය දෙනුලැබ සිටින උසාවියේ ලිපිකරුවකු විසින් සභාපතිතුමා නොපැමිණ සිටින කාලයට දින දමා තිබෙන සියලුම නඩුවල නම් අඩංගු වෙන දිනකට කල්දැමීම කළ හැකිවේ.

## VIII.—ඇප.

26. වරෙන්තුවක් නැතිව යමකු සිරභාරයට ගත් අවස්ථාවෙක 36 (2) හා (4) වැනි වගන්ති යටතේ ඔහුගෙන් ගතයුතු ඇප ඔප්පුව I වැනි උප ලේඛනයේ 5 වැනි පෝරමයේ පැනෙන අඩංගු සම්පූර්ණව ගතයුතුය.

27. (*a*) වරෙන්තුවක් පිට විත්තිකාරයකු හෝ සාක්ෂිකාරයකු සිරභාරයට ගෙන සභාපතිතුමකු ඉදිරියට ගෙනාවිටක එක්කෝ (*b*) විත්තිකාරයාට විරුද්ධව නගනලද චෝදනාව මහෙස්ත්‍රාත්තුමකු ඉදිරියට ගෙනයායුතු තරම් බරපතල අන්දමේ වරදක් පිළිබඳ චෝදනාවක් නම් සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය පරිදි ඇපකාරයන් ඇතිව හෝ නැතිව I වැනි උප ලේඛනයේ 6 වැනි පෝරමයේ පැනෙන අඩංගුවලින් සම්පූර්ණවූ ඇප ඔප්පුවකට—

(i.) උසාවිය ඉදිරිපිට එක්තරා දිනක පැමිණ සිටීමටද; එක්කෝ

(ii.) මහෙස්ත්‍රාත්තුමකු ඉදිරියට පැමිණිලි කළයුතු වරදක් කර තිබේනම්, ඒ ඇප ඔප්පුවේ නියමකරනලද කාලය තුළ මහෙස්ත්‍රාත්තුමා ඉදිරිපිට පෙනීසිටීමටද,

බැඳෙන ලෙස ඒ අයට නියම්කළ හැකිවේ.

ඒ ඇප ඔප්පුවේ මුදල් ගණන රුපියල් එක්සියයකට වැඩිනොවිය යුතුය.

28. උසාවියක් ඉදිරිපිට චෝදනා කරනුලැබ පැමිණ සිටින්නාවූද අවුරුදු 16කට අඩුවූද අයෙකුගේ පියාගෙන් හෝ මවගෙන් හෝ භාරකාරයාගෙන් හෝ වයස් සම්පූර්ණ ඉතා කිට්ටු ඥාතියාගෙන් හෝ ආඥාපනතේ 26 (3) (*b*) දරන වගන්තිය යටතේ ගතයුතුවූ ඇප ඔප්පුව I වැනි උප ලේඛනයේ 7 වැනි පෝරමයේ පැනෙන අඩංගු සම්පූර්ණව ගත යුතුය.

29. මේ ආඥාපනත යටතේ ගන්නාලද ඇප ඔප්පුවක් රජසන්තකයයි නිශ්චයකරනු ලැබ එය යටතේ ගෙවීමට නියමිත දඩ මුදල නොගෙවා තිබෙන විටෙක, ඒ දඩ මුදල අයකරගැනීම සඳහා ආඥාපනතේ 37 (2) වැනි වගන්තිය යටතේ පිස්කල්තුමාට යවන බලපත්‍රය I වැනි උප ලේඛනයේ 8වෙනි පෝරමයේ පැනෙන අඩංගු සම්පූර්ණව පිළියෙලවිය යුතුය.

30. බලපත්‍රය ලැබුණුවිට පිස්කල්තුමා හෝ අනිත් නිලධාරියා විසින් දඩ මුදල ගෙවන්නට නියම්වී සිටින අයගේ චංචල නිශ්චල දෙවර්ගයේම දේපළ ගම්බද උසාවිවල පවරන සිවිල් නඩුවල ඇස්කිසි ක්‍රියාවේ යෙදවීමට පණවනලද නියෝග ප්‍රකාරද, ගම්බද උසාවිවලට නියමිත සිවිල් නඩු සංවිධාන නියෝග මේ සඳහා යෙදෙන අනුමට වෙනස්කරගත් ප්‍රකාරද, අල්ලා තහනම්ට ගෙන විකුණා අයකරගත යුතුය.

## IX.—ඇපැල් ගැනීම.

31. (1) උසාවියකින් දෙනලද නඩු තීන්දුවකට හෝ අඥාවකට විරුඬව ගන්නා සෑම ඇපෑලම ලියා ඇපැල්කාරයා හෝ ඇපැල් කාරයන් විසින් අත්සන්කරනලද පෙත්සමක් අඥාපනයේ 41 (1) වැනි වගන්තියේ සඳහන්කරනලද කාලසීමාව ඇතුළත සභාපතිතුමාට ඔප්පුකළ යුතුය.

ඒ පෙත්සමෙහි පහත සඳහන්වන කරුණු සඳහන්කළ යුතුය. ඒවා නම්:—

(i.) ඇපෑලට හේතුවූ නඩු තීන්දුව හෝ අඥාව නිකුත්කළ උසාවියේ නම;
(ii. නඩුවේ නොම්මරය;
(iii.) නඩුවේ පාර්ශවකාරයන්ගේ නම් හා ඇපැල් ගන්නා අයගේ නම;
(iv ) ඇපැල්ගැනීමට හේතුවූ කරුණු හා
(v.) ඉල්ලා සිටින සහන්ය කවරක්ද යනුත්ය.

(2) අඥාපනයේ 47 වැනි වගන්තියේ නියමිත ප්‍රකාර මුද්දර අලවා නැති සෑම පෙත්සමම පෙත්සම්කාරයාට ආපසු දිය හැකිවේ

(3) ඇපැල් පෙත්සමක් සභාපතිතුමාට ඔප්පුකරනු ලැබූ විටෙක එහි අලවා තිබෙන මුද්දරය එතුමා විසින් අවලංගුකොට ඒ පෙත්සම නඩු පොතත් සමග දිස්ත්‍රික් නඩුකාරතුමාට යැවිය යුතුය.

(4) පෙත්සම යවනවිට සභාපතිතුමා විසින් එය ලැබුණු දිනය ඒ මත සටහන්කොට සහතිකකළ යුතුය.

32 උසාවියකින් දෙනලද යම්කිසි අවසාන අඥාවකට හෝ තීන්දුවකට විරුඬව අඥාපනයේ 41 (1) වැනි වගන්තිය යටතේ ඇපෑලක් ගෙන තිබෙන විටෙක, ඒ ඇපෑල ගන්නා පාර්ශවකාරයා සභාපතිතුමා විසින්, සාමාන්‍ය සිතාසි බාරදීමට නියමිත අන්දමට ලියාපු නොතීසියක් බාරදෙනු ලැබූවිට, උසාවියට පැමිණෙන ලෙස සභාපතිතුමා විසින් නියමකරනලද දිනක උසාවියේ පෙනීසිටිය යුතු බවටත් ඒ ඇපෑලේ තීන්දුව ලැබෙනතුරු බලාසිටිය යුතු බවටත් කොන්දේසි ඇතුළත්කරන ලද්දාවූද I වැනි උප ලේඛනයේ 6 වැනි පෝරමයේ පැනෙන අඩිහ සම්පූර්ණව ලියන ලද්දාවූද ඇප ඔප්පුවක් ඇපකාරයන් ඇතිව හෝ නැතිව ඇපැල් ගන්නා අය විසින් අත්සන්කොට දුන්නොත් මිස නැත්නම්, ඒ ඇපෑල නිසා එකී අවසාන අඥාව හෝ තීන්දුව ඉෂ්ටකිරීම නොනැවැත්විය යුතුය.

33. දඩයක් නොගෙවූ නිසා එක්කෝ සිරගෙට නියමකරනු ලැබූ නිසා සිරගෙට යැවීමට නියමකරනු ලැබ සිටින යමකු විසින් ඇපැල් පෙත්සමක් ඉදිරිපත්කර තිබෙන විටෙක, දඩය ගෙවීම සඳහා එක්කෝ සිර දඬුවම විඳීම සඳහා උසාවියේ පෙනීසිටීමට ඇප දීම පිණිස සභාපතිතුමා වෙත ඔහු ගෙන ගොස් බාරදීමට පිස්කල්තුමාට ඔහු සිරගෙයි සුපිරින්ටැන්ඩන්ට්තුමා විසින් බාරදිය යුතුය.

## X.—නඩු පොතක හෝ දෛනික සිඞ් සටහනක (ජර්නලයක) පිටපත්.

34. යම්කිසි නඩුවක දී තිබෙන තීන්දුවකට හෝ අඥාවකට සම්බන්ධකම් ඇති ඕනෑම කෙනකු විසින් ඉල්ලුම්කර සිටි විටෙක ඔහුට ඒ නඩුවේ හෝ දෛනික සිඞ් සටහනේ හෝ ඉන් යම්කිසි කොටසක පිටපතක්, වචන 120කින් යුත් පිටකට ශත 12 බැගින්වූ ගාස්තුවක් අයකොට දිය හැකිවේ. එහෙත් ඒ අයට යම්කිසි කරුණක් නිසා නොමිලයේ ඒ පිටපත දිය යුතුය කියා සභාපතිතුමාට කල්පනාවේ නම්, එසේ දීමට බලය ඇත්තේය.

## XI.—රෙජිස්ටර් පොත්.

35. සෑම උසාවියේම "දඩ පොත" ය කියා පොතක් I වැනි උප ලේඛනයේ 9 වැනි පෝරමයේ පැනෙන අඩිහ සම්පූර්ණව තැබිය යුතුය. දඩ නියමකරන වේලාවේදී සභාපතිතුමා විසින් ඒ සියලුම දඩ පිළිබඳ විස්තර රෙජිස්ටර් පොතේ සටහන්කළ යුතුය. නඩුවල ඉදිරිපත්කරන මුදල් සහ අනිත් දේවල් පිළිබඳ විස්තරත් උසාවියෙන් නියමකරපු විකිණීම්වලින් ලැබෙන මුදලුත් දිනපතා ලියා සටහන්කරන වෙනත් පොතුත් සභාපතිතුමා විසිනි තැබිය යුතුය.

## XII.—මිශ්‍ර කරුණු.

36. උසාවියක් විසින් අයකර ගන්නාවූ දඩ හා නියමිත දඩත් රජසන්තක කරනලද මුදලුත්, අනෙ‍්‍ය මුදලුත්, කාසිවලින්, ඉතා කිට්ටුව පිහිටි කච්චේරියේ දිනපතා තැන්පත්කළ යුතුය; එක්කෝ මනිඕඩරයකින් ආණ්ඩුවේ ඒජන්තතුමාට යැවිය යුතුය.

37. සෑම සභාපතිතුමෙක්ම එක් එක් කාර්තුව අවසානයේදී, පහත සඳහන්වන ලියවිලි පිටපත් දෙකකින් යුක්තකොට තම උසාවියෙන් ඇපැල් යවනු ලබන දිස්ත්‍රික් නඩුකාරතුමා වෙත යැවිය යුතුය. ඒවා නම්:—

(a) ඒ කාර්තුවේදී සභාපතිතුමා විසින් තබනලද දිනපොතේ පිටපත;
(b) පහත සඳහන් කරුණුත් ඇතුළුව ඒ කාර්තුව තුළ කරනලද වැඩ පිළිබඳ විස්තර ලේඛන:—
(i ) එක් එක් මාසයේදී දමනලද නඩු ගණන;
(ii.) එක් එක් මාසයේදී අවසන් කරනලද නඩු ගණන; හා
(iii.) එක් එක් මාසය අගදී ඉතිරිව තිබුණු නඩු ගණනත්ය.

38. මේ නියෝගවල—

"උසාවිය" යන්නෙන් අදහස්කරන්නේ මේ අඥාපනය යටතේ පිහිටුවන ලද්දාවූ හෝ පිහිටුවනලද්දැයි සලකනු ලබන්නාවූ ගම්බද උසාවියකි.

"දිස්ත්‍රික් නඩුකාරතුමා" යන්නට අතිරේක දිස්ත්‍රික් නඩුකාරතුමෙක්ද ඇතුළත්වේ.

"පිස්කල්තුමා" යන්නට පිස්කල්තුමකු පත්කරනු ලබන පළාතට ඇතුළත්වූ දෙපිට පිස්කල්තුමෙක්ද ඇතුළත්වේ.

"අඥාපනය" යන්නෙන් 1945යේ අංක 12 දරන ගම්බද උසාවි පිළිබඳ අඥාපනය අදහස්කරනු ලැබේ.

"සභාපතිතුමා" යන්නෙන් ගම්බද උසාවියක සභාපතිතුමෙක් අදහස්කරනු ලැබේ.

39. පසුව පනවනලද යම් යම් නියෝගවලින් සංශෝධිතවූ අංක 7,568 හා 1927යේ පෙබරවාරි මස 18 වැනි දින දරන ගැසට් පත්‍රයේ ප්‍රසිඬකරනලදුව තිබෙන ගම්සභා සඳහා පනවනලද ක්‍රිමිනල් නඩු සංවිධානය පිළිබඳවූ නියෝග මෙයින් අවලංගුකරනු ලැබේ.

## I වැනි උප ලේඛනය.

### 1 වැනි පෝර්මය—විත්තිකාරයකුට සිතාසිය.

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි ———— විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ———— විරුඬවයි.

නඩුවේ නොම්මරය :————.

ඉහත සඳහන් විත්තිකාරයාවූ ———— වෙතටයි.

යුෂ්මතා (මෙතැන පැමිණිල්ලේ සාරාංශය ලියනු.) ———— යයි ———— ගම්බද උසාවිය ඉදිරියේ පැමිණිල්ලක් කර තිබේ. ඒ නිසා ඉහත සඳහන් පැමිණිලිකාරයා විසින් යුෂ්මතාට විරුඬව කරනලද පැමිණිල්ල ගැන වගඋත්තර කීමට, යුෂ්මතාගේ සාක්ෂිකාරයනුත් කැටුව 19 ——. වැනි වර්ෂයේ ———— මස —— වැනි දින පෙරවරු 9.30ට ———— ගම්බද උසාවියේ පෙනීසිටින ලෙස මෙයින් යුෂ්මතාට අණකරමි. සෑහෙන කාරණයක් නැතිව යුෂ්මතා එදින උසාවියට පැමිණීම පැහැර හැරියොත් එක්කෝ පැමිණෙන්ට බැරිය කියා සිටියොත් යුෂ්මතාගේ පැමිණීම ගැන බලකිරීමට වරෙන්තුවක් පිටකරන බව යුෂ්මතාට අවවාද වශයෙන් මෙයින් දන්වා තබමි.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— දීය.

————
සභාපතිතැන.

එක්කෝ සභාපතිතුමාගේ අණපරිදි,

————
———— ගම්බද උසාවියේ ලිපිකාරතැන.

ඉහත සඳහන් සිතාසියේ පිටපතක් ———— ට 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීමෙන් ඉහත සඳහන් විත්තිකාරයාට ඒ සිතාසිය බාරදුන් බව මෙයින් සහතික කරමි.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

2 වැනි පෝර්මය,

සාක්ෂිකාරයකුට සිතාසිය.

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි ———— විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ———— ට විරුඬවයි.

නඩුවේ නොම්මරය: ————.

———— වෙතටයි.

ඉහත සඳහන් විත්තිකාරයා (විත්තිකාරයාට යවනලද සිතාසියේ සඳහන්කළ අනුමට පැමිණිල්ලේ සාරාංශය මෙතැන ලියනු) ———— යයි ———— ගම්බද උසාවිය ඉදිරියේ පැමිණිල්ලක් කර තිබේ. තවද යුෂ්මතා පැමිණිල්ලට (එක්කෝ විත්තියට) වැදගත් සාක්ෂි කිය හැකි කෙනෙකු බවට එකී උසාවියේ සභාපතිවූ මට පෙන්නා දී තිබේ.

ඒ නිසා ඒ පැමිණිල්ල ගැන යුෂ්මතා දන්නා කරුණු සාක්ෂි වශයෙන් කීමට 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින පෙරවරු 9.30ට ———— ගම්බද උසාවිය ඉදිරියේ පෙනීසිටීමටද, උසාවියේ අවසර නැතිව උසාවියෙන් නොයෑමටද මෙයින් යුෂ්මතාට අණකරමි.

තවද, සෑහෙන කාරණයක් නැතිව යුෂ්මතා එදින උසාවියට පැමිණීම පැහැර හැරියොත් එක්කෝ පැමිණෙන්ට බැරිය කියා සිටියොත් යුෂ්මතාගේ පැමිණීම ගැන බලකිරීමට වරෙන්තුවක් පිටකරන බව යුෂ්මතාට අවවාද වශයෙන් මෙයින් දන්වා තබමි.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— දීය.

සභාපතිතැන.

එක්කෝ සභාපතිතුමාගේ අණ පරිදි,

———— ගම්බද උසාවියේ ලිපිකාරතැන.

ඉහත සඳහන් සිතාසියේ පිටපතක් 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— ට දීමෙන් ඉහත සඳහන් සාක්ෂිකාරයාට ඒ සිතාසිය බාරදුන් බව මෙයින් සහතික කරමි.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

2 (ii) වැනි පෝර්මය.

ලියවිලි ආදිය ඉදිරිපත්කිරීමට නියමකර යවන සිතාසිය.

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ———— පදිංචි———— විසින් විත්තිකාරයාවූ———— පදිංචි ———— ට විරුඬවයි.

නඩුවේ නොම්මරය: ————.

————වෙතටයි.

ඉහත සඳහන් විත්තිකාරයා (විත්තිකාරයාට යවනලද සිතාසියේ සඳහන්කළ අන්දමට පැමිණිල්ලේ සාරාංශය මෙතැන ලියනු.)————යයි ————ගම්බද උසාවිය ඉදිරියේ පැමිණිල්ලක් කර තිබේ. තවද යුෂ්මතා පැමිණිල්ලට (එක්කෝ විත්තියට වැදගත් සාක්ෂි කිවහැකි කෙනකු බවට එක්කෝ උසාවිය විසින් පරීක්ෂාකර බැලීම සඳහා (ඉදිරිපත්කරන්නට ඕනෑකරන ලියවිල්ල හෝ දෙය මෙයයි සවිස්තරව මෙතැන ලියයුතු.)————ගෙනවුත් ඉදිරිපත්කළ හැකි හෝ සාරවිය හැකි කෙනකු බවට එකී උසාවියේ සභාපතිවූ මට පෙන්නාදී තිබේ.

ඒ නිසා ඉහත සඳහන් නඩුවේ පැමිණිලිකාරයා (එක්කෝ විත්තිකාරයා) වෙනුවෙන් සාක්ෂි කීමට සහ/හෝ (රැගෙනවුත් ඉදිරිපත්කරන්නට ඕනෑකරන ලියවිල්ල හෝ දෙය මෙතැන සවිස්තරව සඳහන් කරනු.)———— 19——වැනි වර්ෂයේ ————මස —— වැනි දින පෙරවරු 9.30ට මේ ගම්බද උසාවියේදී ඉදිරිපත්කිරීමට හෝ කරවීමටද, උසාවියේ අවසරය නැතිව උසාවියෙන් නොයෑමටද යුෂ්මතාට මෙයින් අණකරනු ලැබේ. තවද සෑහෙන කාරණවක් නැතිව යුෂ්මතා එදින උසාවියට පැමිණීම එක්කෝ එකී ලියවිල්ල හෝ ————ඉදිරිපත්කිරීම හෝ කරවීම පැහැර හැරියොත් එක්කෝ පැමිණෙන්නට බැරිය කියා සිටියොත් යුෂ්මතාගේ පැමිණීම ගැන බලකිරීමට වරෙන්තුවක් පිටකරන බව යුෂ්මතාට අවවාද වශයෙන් මෙයින් දන්වා තබමි.

සභාපතිතැන.

19——වැනි වර්ෂයේ————මස——වැනි දින දීය.

එක්කෝ සභාපතිතුමාගේ අණපරිදි,

———— ගම්බද උසාවියේ ලිපිකාරතැන.

ඉහත සඳහන් සිතාසියේ පිටපතක් 19—— වැනි වර්ෂයේ————මස——වැනි දින————ට දීමෙන් ඉහත සඳහන් සාක්ෂිකාරයාට ඒ සිතාසිය බාරදුන් බව මෙයින් සහතික කරමි.

19——වැනි වර්ෂයේ————මස——වැනි දින දීය.

3 වැනි පෝර්මය.

වරෙන්තුව.

————ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ————පදිංචි ————විසින් විත්තිකාරයාවූ————පදිංචි විරුඬවයි.

නඩුවේ නොම්මරය:————.

————වෙතටයි.

ඉහත සඳහන් නඩුවේ විත්තිකාරයෙක් නොහොත් සාක්ෂිකාරයෙක්වූ————ට නියමිත ප්‍රකාර සිතාසියක් බාරදී තිබෙන නමුත් මේ උසාවිය ඉදිරියේ පෙනීනොසිටි බව (එක්කෝ එසේ පෙනීසිටින ලෙස අවවාදකර තිබියදී) පෙනීනොසිටි බව මේ උසාවිය විසින් පිළිගත හැකි අන්දමට පෙන්නාදී ඇත. ඒ නිසා ඉහත සඳහන් විත්තිකාරයා විසින්————දින (මෙතැන පැමිණිල්ලේ සාරාංශය ලියනු.) ———— ලදයි ඉහත සඳහන් පැමිණිලිකාරයා විසින් ————ට විරුඬව මේ උසාවිය ඉදිරියේ කරනලද පැමිණිල්ල පිළිබඳව වගඋත්තර කීම (එක්කෝ සාක්ෂිකීම) සඳහා එකී ———— වහාම අල්ලා මේ උසාවිය ඉදිරියට ගෙන එන ලෙස යුෂ්මතාට මෙයින් අණකරනු ලැබේ.

19——වැනි වර්ෂයේ————මස——වැනි දින දීය.

සභාපතිතැන.

4 වැනි පෝර්මය—සිරගෙට නියමකරනු ලැබූවකු සිරගෙට රැගෙන ගොස් භාරදීමට හා එහි තබාගැනීමට දෙන බලපත්‍රය.

————ගම්බද උසාවියේදීය.

නඩුවේ නොම්මරය:————.

————පළාතේ පිස්කල්තුමා වෙතටයි.

අඞක ————දරන. නඩුවේ ———— වැනි සිරකාරයාවූ————19——වැනි වර්ෂයේ අඞක————දරන ආඥා පනතේ————වැනි වගන්තිය යටතේ 19——වර්ෂයේ ————මස——වැනි දින————ගම්බද උසාවිය ඉදිරියේදී———— වරද ගැන වැරදිකාරයා කරනු ලැබ බරපතල වැඩ ඇතිව/නැතිව————හිරඅඩස්සි කරනු ලැබීමට නියම කරනලදී.

ඒ නිසා එකී සිරකාරයාවූ (සිරකාරයාගේ නම)————සිරගෙට ගෙන ගොස් ඔබගේ අත්සනින් සහතික කරනලද මේ බලපත්‍රයේ පිටපත සමග ඒ සිරගෙයි සුපිරින්ටැන්ඩන්ට්තුමාට බාරදෙන ලෙස මෙයින් ඔබට අණකරමි.

තවද එකී සිරකාරයාවූ————සිරගෙට බාරගෙන ඉහත සඳහන් දඬුවම ඉෂ්ටකර ඉවරවෙනතුරු ඔහු පරෙස්සම් සහිතව එහි තබාගන්නා ලෙස————සිරගෙයි සුපිරින්ටැන්ඩන්ට්තුමාවූ ඔබට මම මෙයින් අණකරමි.

19——වැනි වර්ෂයේ————මස——වැනි දින මගේ අත්සනින් නිකුත්කරනලදී.

සභාපතිතැන.

### 4A වැනි ෆෝර්මය.

### දඩයක් නොගෙවූවිට සිරගෙට යැවීමට නියමකිරීමේ බලපත්‍රය.

———— ගම්බද උසාවියේදීය.

———— පළාතේ පිස්කල්තුමා වෙතටයි.

අංක ———— දරන නඩුවේ (පළමුවැනි, දෙවනි, තුන්වැනි ආදි වශයෙන් ඒ ඒ අවස්ථාවට හරියන ලෙස මෙතැන ලියනු.) ———— සිරකාරයාවූ ———— 19 —— වැනි වර්ෂයේ අංක ———— දරන ආඥාපනතේ ———— වැනි වගන්තිය යටතේ ———— ගැන වරදකාරයා කරනු ලැබ ———— ක දඩයක් ගෙවීමට නියමකරනු ලැබූ නමුත් ඒ දඩය නොගෙවා පැහැර හැර තිබෙන බැවින් ඒ වෙනුවට බරපතල වැඩ ඇතිව/නැතිව ———— දවසකට හිරඅඩස්සියේ සිටීමට නියමකරනලදී.

ඒ නිසා එකී සිරකාරයාවූ (සිරකාරයාගේ නම) ———— සිරගෙට ගෙනගොස් ඔබගේ අත්සනින් සහතික කරනලද මේ බලපත්‍රයේ පිටපත සමඟ ඒ සිරගෙයි සුපරින්ටැන්ඩන්ට්තුමාට බාරදෙන ලෙස එකී පිස්කල්තුමාවූ ඔබට මෙයින් අණකරමි.

තවද, එකී සිරකාරයාවූ ———— සිරගෙට භාරගෙන ඉහත සඳහන් දඬුවම් ඉෂ්ටකර ඉවරවනතුරු ඔහු පරෙස්සම් සහිතව එහි තබාගන්නා ලෙස ඒ සිරගෙයි සුපරින්ටැන්ඩන්ට්තුමාවූ ඔබට මම මෙයින් අණකරමි.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින මාගේ අත්සනින් නිකුත් කරනලදී.

————

සභාපතිතැන.

### 5 වැනි ෆෝර්මය.

### ඇප ඔප්පුව.

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි ———— විසින් විත්තිකාරයාවූ ———— පදිංචි විරුඬවයි.

නඩුවේ නොම්මරය :————.

මෙයින් සිහිපත් වේවා!

———— පදිංචි ———— ද ———— පදිංචි ———— ද යන අප දෙදෙනා එක්වද වෙන් වශයෙන්ද අප මහරජතුමාණන් වහන්සේට රුපියල් ———— ක් ගෙවීමට, එනම්: එකී ———— විසින් රුපියල් ———— ද ———— විසින් රුපියල් ———— ද එකී අප මහරජතුමාණන් වහන්සේට සහ උන්වහන්සේගෙන් පසුව රජ බවට පැමිණෙන්නන්ටද ගෙවීමට ස්ථිර ලෙස බැඳී සිටින්නමු. ඒ මුදල් ගණන් හොඳින්නුත් සත්‍ය ලෙසත් ගෙවීම සඳහා අපි අපද, අපේ උරුමක්කාර පොල්මක්කාර අද්මිනිස්ත්‍රාසිකාරයන්ද අපසතු සියලු දේපළද මෙයින් බැඳ තබමු.

මේ ඔප්පුවේ කොන්දේසිය කෙසේද යත්: ඉහතින් නම සඳහන්වූ ———— 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින පෙරවරු 9.30 ට එකී උසාවියට පැමිණ පෙනීසිට ඊට පසුත් ඒ උසාවියේ සභාපතිතුමා විසින් කලින් කල නියමකරනු ලබන දිනවල සහ වේලාවලත් ඒ උසාවියට පැමිණ පෙනීසිට ඉහතක් නඩුවේ විභාගයට සහභාගි වුණොත් (ඒ ඒ කාරණයට සරිලන අන්දමින් ලියනු.) එවිට මේ ඔප්පුව අවලංගුවී යනවා ඇත. එසේ නොකළොත්, සම්පූර්ණයෙන් වලංගුව පවතිනවා ඇත.

ඊට සාක්ෂි වශයෙන් එක්දහස් නවසිය ———— වැනි වර්ෂයේ ———— මස —— වැනි දිනදී අප දෙදෙනා විසින් මීට අත්සන් තබනලදී.

1. ————.
2. ————.

මා ඉදිරියේ අත්සන් කරනලදී,

————

මූලාදෑනියා (පොලිස් නිලධාරියා).

### 6 වැනි ෆෝරමය.

### ඇප ඔප්පුව.

———— ගම්බද උසාවියේදීය.

පැමිණිලිකාරයාවූ ———— පදිංචි ———— විසින් විත්තිකාරයාවූ ———— පදිංචි ———— ට විරුඬවයි.

නඩුවේ නොම්මරය :————.

මෙයින් සිහිපත් වේවා!

———— පදිංචිකාරයන් වන ———— ද ———— ද වන අපි අප මහරජාණන් වහන්සේට සහ උන්වහන්සේගේ උරුමක්කාරයන්ටත් උන්වහන්සේගෙන් පසුව රජ බවට පැමිණෙන්නන්ටත් රුපියල් ———— ක් හොඳින්නුත් සැබෑ ලෙසත් ගෙවීමට එක්වද වෙන් වශයෙන්ද ස්ථිර ලෙස බැඳී අප සහ අපේ උරුමක්කාර පොල්මක්කාර අද්මිනිස්ත්‍රාසිකාරයනුත් අප සතු සියලු දේපළත් මෙයින් ස්ථිර ලෙස බැඳ තබමු.

මේ ඔප්පුවේ කොන්දේසිය කෙසේදයත් : ඉහතින් නම් සඳහන්වූ ———— 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින පෙරවරු 9.30ට ගම්බද උසාවියට හෝ මහෙස්ත්‍රාත් උසාවියට පැමිණ පෙනීසිට සභාපතිතුමා විසින් හෝ මහෙස්ත්‍රාත්තුමා විසින් කලින් කල නියමකරන දිනවල හා වේලාවල ගම්බද උසාවියේ හෝ මහෙස්ත්‍රාත් උසාවියේ පෙනීසිට නඩුවේ විභාගයට සහභාගි වුණොත් (ඒ ඒ කාරණයට හරියන අන්දමින් ලියනු) එවිට මේ ඔප්පුව අවලංගුවී යනවා ඇත. එසේ නොකළොත් සම්පූර්ණයෙන් බල වලංගුව පවතිනවා ඇත.

ඊට සාක්ෂි වශයෙන් එක්දහස් නවසිය ———— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින මීට අපි අපගේ අත්සන් තබමු.

1. ————.
2. ————.

මා ඉදිරිපිටදී අත්සන්කරනලදී,

————

සභාපතිතැන.

### 7 වැනි ෆෝරමය.

### වරදකරුවන් කොන්දේසි පිට නිදහස්කර යැවීමේදී ගන්නා ඇප ඔප්පුව.

———— ගම්බද උසාවියේදීය.

[2] ———— පදිංචි [1] ———— ට විරුඬව 1945හේ අංක 12 දරන ආඥාපනතේ —— වැනි වගන්තිය යටතේ දඬුවම් කළහැකි වරදක්වූ [3] ———— කරන ලදැයි 19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ———— ගම්බද උසාවිය ඉදිරිපිට නඩුවක් පවරනු ලැබූ බැවින්ද;

ඒ නඩුව ඔප්පුවුණු බවත්, එහෙත් වරදකරුට යම්කිසි දඬුවමක් කිරීම අවශ්‍ය නැති බවත් උසාවියේ කල්පනාවවූ බැවින්ද;

එකී [4] ———— නමැති වරදකරු මාස ———— ක කාලයක් තුළ හොඳ කල්ක්‍රියාවෙන් සිටින බවට වගකීමට ඇපකාරයන් ඇතිව හෝ නැතිව එකී වරදකරුගේ [6] ———— වූ [5] ———— නමැති මා ඇප ඔප්පුවකට බැඳුණොත් ඒ කොන්දේසිය පිට ඒ වරදකාරයා මට බාරදීමට එකී උසාවිය කැමතිවූ බැවින්ද;

එකී කොන්දේසිය පිට එකී වරදකාරයා බාරගැනීමටත් මාස ———— ක කාලයක් තුළ ඔහුගේ හොඳ කල්ක්‍රියාව ගැන වගකීමටත් මා කැමති බැවින්ද;

එසේ කොන්දේසි සහිතව එකී වරදකාරයා නිදහස්කිරීම කල්පනාවට ගෙන එකී ———— නමැති මම අප මහාරාජෝත්තමයාණන් වහන්සේටද උන්වහන්සේගෙන් පසුව රජ බවට පැමිණෙන්නන්ටද රුපියල් ———— ක් කොතැනක හරි පිහිටා තිබෙන මා සතුවූ සියලුම චංචල නිශ්චල දේපලවලින් අයකරගතහැකි අන්දමින් ස්ථිර ලෙස බැඳී සිටින බව ඒත්තුගනිමින් මෙයින් මා බැඳ තබමි.

දැන් මේ ඇප ඔප්පුවේ කොන්දේසිය කවරේදයත් : එකී [9] ———— එකී උසාවියේ තීන්දුව අනුව මාස ———— ක කාලයක් තුළ හොඳ කල්ක්‍රියාවෙන් සිටියොත්, එවිට මේ ඇප ඔප්පුව අවලංගුවී යනවා ඇත.

19 —— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

අත්සන : ————.

ඉහත නම සඳහන් ඇපකාරයා විසින් මා ඉදිරිපිට ඒත්තුගෙන මීට අත්සන් තබනලදී,

————

සභාපතිතැන.

[1] විත්තිකාරයාගේ නම.
[2] විත්තිකාරයාගේ පදිංචිය.
[3] වරද කුමක්දැයි ලියනු.
[4] විත්තිකරුගේ නම.
[5] පියාගේ මවගේ භාරකාරයාගේ හෝ නෑයාගේ නම.
[6] නෑ සබඳකම ලියනු.
[7] මාස ගණන ලියනු.
[8] නම.
[9] විත්තිකාරයාගේ නම.

### 8 වැනි ෆෝරමය.

**වසූරිය තිබෙන ගේපල ලියා තහනම්කර විකිණීම සඳහා නියුක්තකරන බලපත්‍රය.**

————ගම්බද උසාවියේදීය

ක්‍රිමිනෙල් නඩු මාගීය ————.

නඩුවේ නොම්මරය :————.

මහරජතුමා විසින් ————විරුඬවයි.

————පලාතේ පිස්කල්තුමා වෙතටයි.

ඉහත නම සඳහන්වූ———— විසින් 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින බැඳෙන්නට යෙදුණු ඇප ඔප්පුවේ කොන්දේසි කඩකර තිබෙන බැවින් ඔහු විසින් අප මහා රාජෝත්තමයාණන් වහන්සේට ගෙවිය යුතුවූ දඩ මුදල වන රුපියල් ———— ඔහුගේ ගෙවල්, ඉඩම්, බඩු, ණය මුදල් හෝ ඔහුට අයවියයුතු මුදල් අල්ලා තහනම්කොට, අවශ්‍ය වුනොත් විකුණා මුදල්කොට අයකරගෙන අප මහා රාජෝත්තමයාණන් වහන්සේට ගෙවීම සඳහා මේ උසාවිය ඉදිරියට 19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින ඔබ රැගෙන ආ යුතුයි. ඒ සඳහා මේ බලපත්‍රය එහිදී ඔබ වෙත තබාගත යුතුයි.

19—— වැනි වර්ෂයේ ———— මස —— වැනි දින දීය.

————
සභාපතිතැන.

### 9 වැනි ෆෝරමය.

**(36 වැනි ක්‍රිමිනෙල් නියෝගය.)**

———— දිස්ත්‍රික්කුවේ ———— ගම්බද උසාවියේ සභාපතිතුමා විසින් ———— උසාවිය පවත්වා 19—— වැනි වර්ෂයේ ————මාසය තුළදී දඩගසා අයකර ගන්නාලද මුදල් ගණන් ලේඛනයයි.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 10වෙනි තීරයේ දක්වනලද ගණන ගෙවියයුතු පිළිවෙළ | | | | | | | | 19 | 20 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | | |
| දඩය ගැසූ දිනය | නඩුවේ නොම්මරය | වැරදිකාරයාගේ නම | අපරාධය හෝ වරද | [illegible] | ගෙවන්නට නියමකළ දඩ මුදල | අයකරගත් ගණන | අයකරගත් දිනය සහ රිසිට් නොම්මරය | පැමිණිලිකාරයාට ගෙවූ ගණන | [illegible] | මුලාදෑනීන්ගේ ගාස්තු මුදල | පොලීසියේ ගාස්තු මුදල | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | | 20 වැනි තීරයේ සඳහන් කරනලද කරුණු නිසා අයකර නොගත් | වෙනත් කරුණු |
| | | | | | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | රු. ස. | |
| | | | | | | | | | | | | | | | | | | | |

මෙය ———— මාසයේදී ගසනලද දඩ පිළිබඳ නිවැරදි ලේඛනයක් බවත්, මා විසින් මේ ලේඛනයේ හරි වැරදි පරීක්‍ෂාකර බැලූ බවත් ———— මාසයේ ———— අයකර නොගෙන හිඟපිට තිබුණු සියලුම දඩ මේ ලේඛන පොතේ ———— මාසයේ ලේඛනයට ගෙනගිය බවත් මෙයින් සහතික කරමි.

————
සභාපතිතැන.

### II වැනි උප ලේඛනය.

**6 වැනි නියෝගයේ සඳහන් කරනලද වරදවල්.**

(*a*) සූදුකෙළීම හෝ සූදුකෙළින තැනක ඉඳ සම්බවීම හෝ ගෙයක්වත් ඉඩමක්වත් සූදුකෙළීම සඳහා පාවිච්චිකරන්නට ඉඩදීම.
(*b*) ගෙවිලට ගල් ගැසීම.
(*c*) ඝෝෂාකිරීමෙන් හෝ කාටත් ඇසෙනසේ අසභ්‍ය කවි සින්දු කීමෙන් රාත්‍රියේදී මහජනයාගේ නින්දට බාධාකිරීම.
(*d*) අශෝභන ලෙස නිර්වස්ත්‍රව සිටීම.
(*e*) ප්‍රසිද්ධ පාරවලට අලාභ හානිකිරීම.
(*f*) හොරකම.
(*g*) පාරේ කෝලාහලකිරීම.
(*h*) කුවාලකිරීම.
(*i*) කවුසර බෝග ආදිය විනාශ කිරීමෙන් මැරවරකමක් කිරීම.
(*j*) බීමත්කමින් නොමනා ලෙස හැසිරීම.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

**ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.**

**නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,450 (රත්නපුර).**

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1948ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්යැයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශ කරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතු කරණ බවද එකී ආඥාපණතේ 4 වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම 1948ක්වූ අගෝස්තු මස 23වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය

ජේ. ඇල්. ඩී. ඩේවිඩ්සන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්තතුමා වෙනුවට.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ පිහියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකකීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුළු කෝරලේ උඩපත්තුවේ පොතුපිටිය යන ගමේ පිහිටා තිබෙන මෙකී පහත සඳහන් බිම්කට්ටි, එනම්:—

**නො. A 528 දරණ මුල් සිතියම.**

| බිම කට්ටිය. | ඉඩමේ නම. | | විස්තර. | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | කරම්වගේහේන (ඩී. ආර්. සී. පාරට වෙන් කර තිබෙන බිම් තීරුව) | | හේන | .. | 0 | 1 | 26 |
| 2 | එම | .. | එම | .. | 0 | 1 | 36 |
| 3 | කරම්වගේහේන | .. | එම | .. | 1 | 0 | 15 |
| 4 | එම | .. | එම | .. | 1 | 0 | 9 |
| 5 | එම | .. | එම (ස්ථිර ගොඩ හැගිල්ලක් තිබේ) | | 1 | 0 | 9 |
| 6 | එම | .. | හේන (ග්‍රාමීය ආරොග්‍ය ශාලාව තනාගෙන එහ ගොඩනැගිල්ල තිබේ) | | 3 | 1 | 30 |
| 7 | — | .. | ඩී. ආර්. සී. පාර | .. | 0 | 0 | 30 |
| 8 | කරම්වගේහේන (ඩී. ආර්. සී. පාරට පාරව වෙන් කර තිබෙන බිම්තීරුව) | | හේන | .. | 0 | 2 | 20 |

මීට මායිම්—උතුරට ජී. ජන්දිරිස් සහ තවත් අය අයිතිකම් කියන කරම්වගේහේන; නැගෙනහිරට ජී. ජන්දිරිස් සහ තවත් අය අයිතිකම්කියන කරම්වගේහේන; දකුණට ජී. ජන්දිරිස් සහ තවත් අය අයිතිකම්කියන කරම්වගේහේන සහ කේ. ඒ. සිරිවඩිහාමි සහ තවත් අය අයිතිකම්කියන කරම්වගේවත්ත; බස්නාහිරට ආණ්ඩුව අයිතිකම්කියන කරම්වගේවත්ත (නො. M.35, නො. 2,434 දරණ මුල් සිතියමේ), ආර්. සිංඤෝ සහ තවත් අය අයිතිකම්කියන කරම්වගේදෙනිය, ජී. ජන්දිරිස් සහ තවත් අය අයිතිකම්කියන කරම්වගේහේන.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 14,822, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ ඉඩම් නිරවුල්කරණ කුඹාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ උතුරු කටුගම්පල කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,201. ගම—දිගල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මනන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1640 | දක්ෂනහමුලවත්ත .. | ගසිගේ පදිංචි දලුවත්තේගේ කොන්ස්තන්තිනු සපරමාදු අප්පුහාමි | පොල්වත්ත | .. 0 3 4 |
| 204 | හල්ගහමුලවත්ත .. | (1) හමරක්නමුදියන්සේලාගේ රන්මැණිකා හා තවත් අය, (2) කඹුරුපොල පදිංචි සේනානායක මුදියන්සේලාගේ ගුණසේකර හා (3) වීගල්ලේ පදිංචි ඈම්. එච්. බස්නායක | එම | .. 1 2 22 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුව.

---

**No. 14,323, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ කුඹාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ දකුණු කටුගම්පල කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 996A. ගම—උඩුබද්දාව මහ අගාර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මනන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 107 | කඩුරුගහමුලහේන .. | (1) කඳන පදිංචි හන්ගොඩවිල පිලිප් දබරේරා, (2) උඩුබද්දාව මහ අගාර් පදිංචි කුරුප්පුආරච්චිගේ එච්චප්පු රෙද්දියා, (3) ඕ. ඈල්. කේ. කේ. ඈන්. රාමනාදන් චෙට්ටියාර් හා (4) එම කන්නප්පා චෙට්ටියාර්, නො. 255, වැල්ලවීදිය, කොළඹ, (5) ඩී. සී. ජයසූරිය හා (6) ඈන්. ජී. මැලනී, පෝස්ට් මාස්ටර්, රාගම | පොල්වත්ත | .. 1 1 8 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුව.

---

**No. 14,324 S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ කුඹාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ උතුරු කටුගම්පල කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,208. ගම—ඇම්බේබව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මනන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 219 | රුක්අත්තනගහමුලහේන | (1) දනනායකමුදියන්සේලාගේ හිටිහාමි සහ (2) කුලියාපිටියේ පදිංචි ආනා චේනා වූනා අහමදු තම්බි | හේන | .. 0 1 0 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, එහි සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුව.

---

**No. 14,325, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ කුඹාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ මැද්දෙකැටියෙ කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,553. ගම—තොරනගෙදර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මනන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 42 | මුවන්හලවත්ත .. | (1) හැන්සි වාලර් පීරිස් මැතිනිය, බලිවර් කාසල්, ග්‍රෙගරීස් රෝඩ්, කොළඹ, (2) මලවිසිංහමුදියන්සේලාගේ බන්ඩිරාල, (3) තෙත්තපොලගෙදර හන්ආරච්චිවූ අමරකෝන් මුදියන්සේලාගේ බණ්ඩා, (4) කොරොස්ස පදිංචි මලවිසිංහමුදියන්සේලාගේ හේරත්හාමි, (5) එම ගම පදිංචි එම මුදලිහාමි විදානෙ, (6) තොරනගෙදර පදිංචි අමරකෝන් මුදියන්සේලාගේ කිරිහාමි හා (7) එම ගම පදිංචි එම පුංචප්පුහාමි | පොල් වත්ත | .. 0 1 12 |
| 141 | කෝන්ගහමුලහේන | කුරුණෑගල කඩම්දිගේ කේ. ඈම්. පී. ආර්. චෙට්ටියාර් බාරේ ඈම්. ඈස්. ඈම්. සෝමසුන්දරම් චෙට්ටියාර් .. | හේන | .. 1 0 29 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈස්. ඈෆ්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුව.

No. 14,326, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සත්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ ඉඩම් නිරවුල්කරණ කුඩාරමේදී මෙන්දේසිකර විභාගන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ මැද්දෙකැටිය කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,562. ගම—තලගේන්වැව.

| නො. | ඉඩමේ නම. | පල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 9 | තුඹහේන .. | පොතුහැර පදිංචි (1) කුන්චිඋදියරලගේ අගනා ලෙබ්බෙ හා (2) සෙල්ල තම්බිගේ සෙල්ල උදයාර්ගේ උරුමක්කාරයෝ | හේන .. | 0 1 13 |
| 10 | එම .. | එම .. .. .. .. | එම .. | 0 1 37 |
| 12 | තුඹහේනවත්ත .. | එම .. .. .. .. | පොල්වත්ත .. | 1 0 20 |
| 39 | කඹරගොඩහේන .. | අසේනා ලෙබ්බෙගේ උරුමක්කාරයෝ .. .. | හේන .. | 0 1 26 |
| 40 | එම .. | (1) සෙල්ලම්මාගේ උරුමක්කාරයෝ හා (2) අසේනා ලෙබ්බෙගේ උරුමක්කාරයෝ | එම .. | 0 3 39 |
| 42 | තුම්පෙහේනවත්ත .. | සෙල්ලඋඩයාර්ගේ උරුමක්කාරයෝ හා (2) අසේනා ලෙබ්බෙගේ උරුමක්කාරයෝ | පොල්වත්ත .. | 1 1 2 |
| 43 | එම .. | අසේනා ලෙබ්බෙගේ උරුමක්කාරයෝ .. .. | එම .. | 0 0 20 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈ. ආර්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

No. 14,327, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සත්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ කුඩාරමේදී මෙන්දේසිකර විභාගන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ මැද්දෙකැටියේ කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 11ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,564. ගම—මැබෙල්පොල.

| නො. | ඉඩමේ නම. | පල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෝන්ගහමුලවත්ත .. | (1) දඹදෙනිහත්පත්තුවේ මිරව්වකෝරළේ පොත්තත්මෙල පදිංචි මුතුගල්පේදිදුරයාලාගේ සල්මා, (2) පල්ලවෙල පදිංචි දිවුලුගල්පේදිදුරයාලාගේ තෙන්නා, (3) එම හොරතලා, (4) එම බිලින්දුගේ උරුමක්කාරයෝ සහ (5) දෙවටපේදිදුරයාලාගේ හපු (මැන්දම්) | පොල්වත්ත .. | 3 1 12 |
| 32 | පරගොල්ලේහේන .. | (1) අනුරඩපුරේ පදිංචි දෙව්වපේදිදුරයාලාගේ පෙරුම්, (2) අදිදුක්කගේ පදිංචි හොරතල්පේදිදුරයාලාගේ මැනිකා, (3) එම උැඹුනා, (4) ගෙත්ගොඩ හිටපු කෝරාලවන කෝනාර මුදියාන්සේලාගේ උක්කුබණ්ඩා සහ (5) ගල්කන්දේගේ පුංචි හෝනාහාමි | හේන .. | 0 3 35 |
| 67 | ගෙදරමැවගාවවත්ත නොහොත් කොතල පිට්ටවත්ත | (1) තල්ලිගද්දේ පදිංචි දෙහෙවතපේදිදුරයාලාගේ හොරතලි, (2) ලියනපේදිදුරයාලාගේ පොඩිඩි, (3) දෙහෙවතපේදිදුරයාලාගේ පිව්වි, (4) එම උක්කු, (5) තාරම්බල පදිංචි වීරප්පා වෙට්ටියාර්, (6) අමන්දෙලුවේ පදිංචි මිල්බම් පෙරේරා ජයතිලක සහ (7) මිනුවන්ගොඩ ගල්කන්දුව පදිංචි සිංහලපේදිගේ ගුනේරිස් | පොල්වත්ත .. | 3 3 24 |
| 78 | ගලමුල්ලහේන .. | මැබෙල්පොල පදිංචි (1) හේමාපේදිගේ සිව්මා, (2) එම සර්දියා, (3) දෙම්වපේදිගේ බිලින්දි සහ (4) එදිරිසිංපේදිගේ අර්නෝලියා | හේන .. | 1 2 10 |
| 88 | පහාකනාලවත්ත .. | (1) දෙව්වපේදිදුරයාලාගේ ඩිංගා, (2) එම හොරතලා, ඔහු වෙනුවෙන් සහ (3) එම එල්ලි, (4) එම කිරීයා සහ (5) එම පුංචා යන බාලයින් වෙනුවෙන්ද | පොල්වත්ත .. | 1 1 18 |
| 97 | කොළොන්ගහමුදහේන නොහොත් අස්වැද්දුමේ හේන | (1) මීගොමු දිස්ත්‍රික්කයේ කලුවෙල්ගොඩ පදිංචි ඇල්බින් තිසේරා බසනායක අප්පුහාමි, (2) කොළඹ දිස්ත්‍රික්කයේ මාකෙවිට පදිංචි සියඹලාපිටියේ දොන් ජුවන් අප්පුහාමි සහ (3) එම ලූකස් අප්පුහාමි | හේන .. | 2 1 14 |
| 147 | දන්ගහමුලවත්ත .. | හොරතල් පේදිදුරයාලාගේ හපු .. .. | පොල්වත්ත .. | 2 0 5 |
| 165 | කොළඹගහමුලවත්ත .. | මැබෙල්පොල පදිංචි (1) ජයවර්ධන රොසලින්හාමි, (2) එම ගරජනා මෙරීහාමි, (3) ජයකොඩිආරච්චිගේ රෝසා මෙරීහාමි, (4) ජයවර්ධන ජුවන් ජෝසප්, (5) එම මේරීනෝනා සහ (6) එම ඇලිස්නෝනා | වී .. | 0 0 8 |
| 169 | .. .. | එම .. .. .. | පොල්වත්ත .. | 0 3 34 |
| 168 | .. .. | එම .. .. .. | එම .. | 0 1 27 |
| 177 | මීගහමුලවත්ත .. | (1) හඳලංකාවේ පදිංචි ඕ. සුහසිංහ සහ (2) මැබෙල්පොල පදිංචි තන්තිකිතආරච්චිගේ මානෙල්අප්පු | හේන .. | 0 0 32 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1948ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්යාලයේදීය.

ඈ. ආර්. අමරසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

No. 14,328, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සත්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 8වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට කුලියාපිටියේ කුඩාරමේදී මෙන්දේසිකර විභාගන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ මැද්දෙකැටියේ කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 22ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,571. ගම—පොතුහැර.

| නො. | ඉඩමේ නම. | පල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 40 | පරගහමුලවත්ත .. | (1) කාල්ලෙගම පදිංචි අසනාලෙබ්බෙලාගේ අහමදු ලෙබ්බෙ, (2) එම ගම පදිංචි එම හමීදු ලෙබ්බෙ, (3) මැටිවැවේ පදිංචි එම අලීමා නාච්චි හා (4) පොතුහැර පදිංචි සේගු මීරා ලෙබ්බෙ ගුරුන්නැහෙලාගේ සේගු මොහමදු | පොල්වත්ත .. | 0 3 15 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අඳුම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 49 | පරගහමඩිත්ත .. | පොතුහැර පදිංචි (1) පිච්චතම්බිලාගේ මුකුලුස් නාච්චි, (2) අසනාලෙබ්බෙලාගේ අමීන උම්මා, (3) එම පදුම්මා, (4) එම අලිමා නාච්චි, (5) එම හරීෆා උම්මා, (6) එම සේගුඹ දූවුදු, (7) එම මොහමඩ් හෙරීෆ්, (8) එම හව්අම්මා, (9) ඔසානාලෙබ්බෙ විදානෙලාගේ මොහමඩු ඉස්මයිල්, (10) සේගු අබ්දුල් රහිමන්, (11) දම්පිටියේ පදිංචි ඔසානා ලෙබ්බෙ විදානෙලාගේ පදුම්මා, (12) ඔබේගේමිදියල පදිංචි මරික්කාර් විදානෙගේ අමීනා උම්මා (13) එම ගම පදිංචි එම මීරා හුසේන්, (14) පොතුහැර පදිංචි පකීර් තම්බිලාගේ පොත්තී අම්මා නොහොත් කඩිජ උම්මා හා (15) අක්යාල පදිංචි ඉස්මයිල් ලෙබ්බෙලාගේ මාරිඅම්මු නාච්චි | පොල්වත්ත .. | 0 | 1 | 32 |
| 50 | පරගහමඩිත් තවත්ත නොහොත් කහටගහ මුලවත්ත | (1) ඔබලස්සේ පදිංචි අබ්දුල් කාදර් මොහොට්ටියරලාගේ සේගු දාවූදු, (2) කාල්ලෙගම පදිංචි අසනාලෙබ්බෙලාගේ අහමදු ලෙබ්බෙ, හා (3) ඔබලස්සේ පදිංචි මොහමඩ් අබ්දුල් කාදර් මොහොට්ටියරලාගේ අදම්පුල්ලෙ | එම .. | 2 | 0 | 22 |
| 52 | මීගහමුලවත්ත .. | (1) උදියරලාගේ අසනා ලෙබ්බෙ වෙල් විදානේ, (2) මොහිදීන් කුප්පයලාගේ ඉබුරකිම් නෙයිනා, (3) පකීර්තම්බිලාගේ අසනා ලෙබ්බෙ හා (4) කුරිකොටුවේ පදිංචි මොහමඩු ඉස්මයිල් විදානෙ හා ඔහුගේ සහෝදර සහෝදරියෝ | එම .. | 0 | 2 | 7 |
| 59 | කෝන්ගහමුලවත්ත .. | දම්පිටියේ පදිංචි සජ්ජ තම්බිලාගේ සම්බි ලෙබ්බෙ .. | එම .. | 2 | 0 | 8 |
| 67 | ගල්කනගෙවත්ත නොහොත් කිඹිරිගස්කොටු වෙලිල්ලෑව | එම .. .. .. | එම .. | 0 | 2 | 5 |
| 89 | මීගහමුලවත්ත .. | පොතුහැර පදිංචි (1) පිච්චතම්බිලාගේ අසනා ලෙබ්බෙ, (2) අබ්දුල් රහිමන්ගේ මොහමඩු හනීෆා, (3) එම සජීර් උම්මා, (4) එම අසනා ලෙබ්බෙ, (5) එම මොහමඩු ඉස්මයිල් හා (6) නාරම්මල පදිංචි ඇස්. පී. ආර්. ඇම්. රමනාදන් චෙට්ටියාර් | එම .. | 0 | 3 | 28 |
| 170 | කොම්බලුම්හේන .. | (1) හන්ගිලිපොල පදිංචි මේරගල්පේඹ්රුරයලාගේ හොරතලා, (2) වැවගෙදර පදිංචි ලියනපේඹි මිත්තියා, (3) දම්පිටියේ පදිංචි සම්සුදීන්ගේ මුස්වාෆා, (4) එම ගම පදිංචි එම මොහමඩු හනීෆා හා (5) වෙයන්ගොඩ පදිංචි ලූසිනා පෙරේරා ජයතිලක | හේන .. | 2 | 1 | 37 |
| 177 | කුරිගහමුලවත්ත .. | පොතුහැර පදිංචි කාසිලෙබ්බෙ උදයාරෙලාගේ හමිදු ලෙබ්බෙ | පොල්වත්ත .. | 0 | 0 | 39 |
| 180 | මුදුනගහමුලහේන .. | පොතුහැර පදිංචි (1) කුන්ජි උදයාරෙලාගේ අබ්දුල් කරීම් හා (2) අප්පුතම්බි උදයාරෙලාගේ කුච්චි උදයාරෙ | හේන .. | 0 | 1 | 33 |
| 182 | කෝන්ගහමුලහේන .. | දිවුරුම්පොල පදිංචි (1) සෙයියදු අලිමා ඔච්චලාගේ කඩිජ උම්මා, (2) සේගු අසන්ගේ මොහමඩු සලී, (3) එම සාරා උම්මා, (4) එම සෙයිනාල් අබුදීන් හා (5) එම සේගු මොහමඩු | එම .. | 0 | 0 | 32 |
